ලංකාදීප
2022 මාර්තු 13 වැනිදා ඉරිදා

රසවින්ද

අවුරුදු හතළිහ ඉක්මවුවාට පසුව ගැබ් ගැනීමේ අවදානම පිළිබඳව පවුල් සෞඛ්‍ය සේවිකාව මෙන්ම වෛද්‍යවරුන් ද ජීනාදරීට පැහැදිලි කර දී තිබිණි. එහෙත් ඇය අබමල් රේණුවක හෝ බීයක් ඇති කර ගත්තේ නැත. ඇය සිටියේ හොඳ නිරෝගී සුවයෙනි. නිවසේ කුදුමහත් කටයුතුත්, දරුවන්ගේ කටයුතුත් ඇය නොපිරිහෙළා ඉටු කළාය. ගැබිනි මව්වරුන්ට පෝෂ්‍යදායකයයි කියැවෙන ඕනෑම ආහාරයක් ඇය වෙනුවෙන් සපයන්නට කිත්සිරි සැදීපැහැදී සිටියේය. හිත යටින් මොන තරම් සිනාසුණත්, නැති තැන විවේචනය කළත් ගැබිනියකට කෑම ටිකක් දීම කුසලකර්මයක්යයි සැළකෙන සමාජයක විසූ බැවින් පලතුරු ටිකක්, රස කැවිල්ලක්, කෑම පාර්සලයක් නොලැබුණ දවසක් ජීනාදරීට එළඹුණේම නැත. වෙනත් ගෙවල්වල ගැහැනුන්ට මෙන් සැමියාගෙන් හෝ දරුවන්ගෙන් කිසිදු කරදරයක් සිදු නොවූ බැවින් ඇයට සිත් පීඩාවක් ද නොවිණි. හිටිහැටියේම ඇයට බීයක් දැනුණේ මන්දැයි කිත්සිරිට තේරුම් ගත නොහැකි වූයේ එම නිසාය.

ජීවිතය

ජනප්‍රිය ලේඛිකා
චන්දි කොඩිකාර
ලියන නවකතාව

44 ගෑනු දරුවො

ලොකු මහත් වෙනකොට තාත්තගෙ තුරුළට ගන්න සිරිතක් නෑ

02 කොටස

ඔහු ඇගේ අත අල්ලාගෙනම සීරුවෙන් මිදුලට බැස අඹ ගහ යට ලෑලි බංකුවේ වාඩි ගත්තේය. වහල කෙළවරේ එල්ලුණ විදුලි බුබුලේ ආලෝකය එතැනට වැටුණේ යාන්තමිනි. සීතල සුළඟක් ද ගත සිසිල් කරමින් හමා ගියේය.

"කවදවත් නැතුව එහෙම බයක් දැනුණෙ ඇයි නෝනෙ..?"

ඔහු විමසුවේ ඇගේ ගෙල වටා අත යවා හිස උරහිසට හේත්තු කර ගනිමිනි. සිතට දැඩි ආදරයක් ඇතුළු වූ කල නෝනේ වශයෙන් ජීනාදරී අමතන්නට කිත්සිරි පුරුදුව සිටියේය.

"මම ලොකු දුවට කිව්වා හෙට උදේ ආච්චි එයි කියලා එක්ක යන්න.. බඩට ඔළුව තියාගෙන යන්න බෑ කියලා ඇඬුවනෙ.. එතකොට මාව හෝස් ගාලා පිච්චුණා.." ජීනාදරී හීල්ලුවාය.

"ඕක ඉතින් එච්චර හිතට ගන්න දෙයක්යැ.. මාත් ගෙදර ඉන්න හින්ද කෙල්ලට යන්න බෑ කියලා හිතෙන්න ඇති.."

"එහෙම තමයි කියන්නෙ නම්.. තාත්තා තනියම නංගියි මල්ලියයි බලා ගන්නෙ කොහොමද කියලා කියනවා.."

"මටත් කෙල්ල නැතුව පාළු හිතෙයි.. එක්කො ඔන්න ඔහෙ ගෙදර ඉන්න කියමු ද..? ඔය දවස් දෙක තුනේ මහා ලොකු වෙනසක් වෙයි කියලා මම හිතන්නෙ නෑ.."

කිත්සිරි සුපුරුදු සැහැල්ලුවෙන් පැවසුවේය.

"අම්මා තදින්ම කියලා තියෙන්නෙ මම ඉස්පිරිතාලෙ යන්න ඉස්සර ලොකු දුව එහෙ එක්ක යනවා කියලා.. ඒක වෙනස් කරන්න ගියොත් දන්නවනෙ ඉතින්.. වෙනසක් වුණා නැතා මං එනකම් එහෙ හිටපුවාවෙ.." ඇය අවධාරණයෙන් පැවසුවාය.

"මට නම් මගෙ කෙල්ල තවමත් පොඩියි.. පුංචි කාලෙ කැතකුණු අත ගෑව මට අනිත් මොන රාජකාරියත් මහලොකු දේවල් වෙන්නෙත් නෑ.. ඒත් ඉතින් ඔව්වා අම්මට තේරුම් කරලා දෙනවට වැඩිය හොඳයි එයා කියන විදියකට කරන එක.." එවර ඔහු කීවේ සුසුමක් හෙළමිනි.

"ඔව්.. නැත්නම් පැත්ත පළාතෙ හැරිලා බලන්නෙ නැතුව ඉඳියි.. මේ වෙලාවේ ඉතින් අපිට හයියට ඉන්නෙ අම්මා විතරයිනෙ.."

"ඉස්සර වාගෙ නෙමෙයි දැන් අම්මා කෙල්ලගෙ හිත රිදෙන විදියෙ දේවල් කියනවනෙ.. ඒ හින්ද එහෙ යන්න බෑ කියලා හිතුණ ද දන්නෙ නෑ.." කිත්සිරි සැක පළ කළේය.

ඔහු හැමදමත් දරුවන් එකම වයසේ සිටිනවා දකින්නට ප්‍රිය කරන තාත්තා කෙනෙකුයයි කියමින් ඇතැම් අවස්ථාවල ජීනාදරී ඔහුට සරදම් කළාය. ඔහුට දරුවන් ඇති වීමක් නැත්තේ ඒ නිසායයි ඇය තනිව සිතූ අවස්ථා ද තිබිණි. නවයේ පන්තියේ ඉගෙනුම ලබන දිනේෂි පිටේ එල්ලාගෙන ලුණු ගෙන යන්නට ඔහු කවදවත් පැකිලුණේ නැත. එවන් අවස්ථාවල සිනාසෙමින් බලා සිටිනවා මිස ඔහු වළක්වන්නට ඇය උත්සාහ දරන්නේත් නැත.

"උඹට පිස්සු ද බං කිත්තො..? හෙට අනිද්ද ගෙට වෙන්න ඉන්න කෙල්ල පිටේ එල්ලාගෙන ලුණු ගෙනියන, ඔඩොක්කුවේ තියාගෙන නළවන තාත්තලා ඉන්නව ද..? පින් සිද්ද වෙයි රටේ ලෝකේ මිනිස්සු හිනස්සන්නෙ නැතුව හිටපන්.."

කියමින් ඔහුට දෙස් පැවරුවේ ඔහුගේම අම්මා හීන් නෝනාය. කිත්සිරිගේ බොළඳ හැසිරීම්වලට උඩගෙඩි දෙන්නේයයි ඇය ජීනාදරීටත් බැණ වැදුණ අවස්ථා තිබිණි.

"මේකි මගෙ ලොකු කෙල්ල මිසක් වෙන කාගෙවත් එකියක් නෙමෙයිනෙ අම්මා.. ඒකිව වඩාගෙන ඉන්න මට බැරිනම් කාට ද පුළුවන්..?" ඔහු විමසන්නේ උදහසිනි.

"උඹත් එක්ක කතා කරන කට ගලක උලා ගත්තා නම් හොඳයි කිත්තො.. අනේ අම්මපා උඹලගෙ ඉහනිකට පැහුණේ නියඟෙට ද මං අහන්නෙ..? ගෑනු දරුවො ලොකුමහත් වෙනකොට තාත්තගෙ තුරුල්ලෙන් ඈත් කරනවා මිසක්කා තුරුල්ලට ගන්න සිරිතක් නෑ.. ආං ඒක හොඳට මතක තියා ගනිං.. කොහෙද ඉතින් අම්මලාටත් එච්චා පහදලා කියලා දෙන්න ඕනෑකමක් නැනෙ.."

ජීනාදරී දෙස ද නොපහන් බැල්මක් හෙළමින් හීන් නෝනා කී දිනයෙක කිත්සිරි බොහෝ කනස්සල්ලට පත් වූයේය. ජීනාදරීගේත් සිත රිදිණි. පියෙකුගේත්, දියණියකගේත් ආදරණීය, සුපිවිතුරු බැඳීමට තහංචි පනවන්නේ කුහක සිත් ඇත්තවුන් නොවන්නේදැයි ඇයට සිතිණි. තමන්ගේම ලෙයින් උපන් දියණිය දෙස කාමුක ඇස්වලින් බලන්නට තාත්තලා පොළඹවන්නේ මෙවන් අමන මතිමතාන්තර විසින්ම විය යුතුය. නැන්දම්මා සමඟ තර්ක කර සිත් පීඩාවක් ඇති කර ගන්නට නොහැකි නිසා ජීනාදරී නිහඬ වුවත් කිත්සිරිනම් බොහෝ දේවල් කීවේය.

"ඇයි තාත්තෙ.. මම තාත්තගෙ කරේ එල්ලුණා කියලා ආච්චිට ඒ තරම් කේන්ති ගියෙ..?"

එදින රෑයේ දිනේෂි බියමුසු හඬින් ඇසුවේ වෙනද මෙන් ඔහු අසළ දැවටෙන්නේ නැතිවය. කිත්සිරිට සිය මව කෙරෙහි තරහක් ද, දියණිය කෙරෙහි මහා අනුකම්පාවක් ද එක්වරම ඇති විය. ඔහු ඇය තුරුළු කරගෙන පිල මත වාඩි වූයේය.

"මේකයි පුතේ.. ආච්චිලා හැදිලා තියෙන්නෙ පිරිමි දේවත්වයෙන් අදහන්න ඕනෑ කියලා හිතන සමාජෙක.. එයාලා හිතන්නෙ ගෑනු පිරිමි හරිහරියට කතාබහ කරන එකත් ලොකු පවක්, පිරිමින්ට කරන නින්දවක් කියලා.. තාත්තා කෙනෙක් දුවෙක් වඩා ගන්න එකත් වරදක් විදිහට දකින්නෙ ඒකයි.."

දියණියගේ සිතත් නොරිද්ද, සිය මවගේ දෙස් ද නොඋලුප්පා, තමාත් දියණියත් අතර ඇති බැඳීම ද නොවෙනස් වෙන ආකාරයට සිද්ධිය සැහැල්ලු කර කතා කරන්නට කිත්සිරි උත්සාහ කළේය. එහෙත් ඔහුගේ සිතේ පැවතියේ මහා බර ගතියකි.

"අර පෑලිස් සීයා හොඳටම බීපු දවසට කෑ ගහ යන්නෙ පිරිමි ජාතිය උතුම් ජාතිය උදේ හවහට මල් පුදපිය, ගෑනු ජාතිය ජරා ජාතිය ගලේ ගහලා මරා දපිය කියකියා.. එහෙම කියන්නෙ එයත් දෙවියෙක් කියලා හිතාගෙන වෙන්න ඇති නේද තාත්තෙ..?"

දිනේෂි එය විමසූ ස්වරය කිත්සිරි සිනා ගන්වන්නට සමත් වූයේය. ඇය දැන් සිටින්නේ දැනුම්තේරුම් ඇති වයසේ නිසා සමාජයේ විෂම බව පිළිබඳව ටිකින් ටික තේරුම් කළ යුතුයයි ඔහු ඉටා ගත්තේ එදිනමය.

"තමන්ගෙ අම්මත් ගෑනියක් කියලා අමතක කරන ඒ වාගෙ මෝඩ මිනිස්සුත් මේ ලෝකේ ඉන්නවා පුතේ.. ආච්චිලා වාගෙ ගෑනුම ඒවට උඩගෙඩිත් දෙනවා.. හොඳට මතක තියා ගන්න ලෝකේ පවතින්නෙ තනිකර ගෑනු හින්දවත් තනිකර පිරිමි හින්දවත් නෙමෙයි දෙගොල්ලම හින්ද.. මිනිස්සුන්ට විතරක් නෙවෙයි සත්තුන්ට, ගස්කොළවලට පවා ගෑනු පිරිමි බේදේ ඕනෑ වෙනවා.. ලෝකෙ වෙනස් තැනක් වෙන්නෙත් එතකොට.. ලස්සන තැනක් වෙන්නෙත් එතකොට.."

කිත්සිරි කියාගෙන යද්දී දිනේෂි ඉතා ඕනෑකමින් ඇහුම්කන් දී සිටියාය. ආච්චිගේ කතාවෙන් පසු ඇගේ මුහුණේ ඇති වී තිබූ බයාදු බව හා දෙම්නස තුරන් වී තිබෙනු දැක ඔහු සතුටු වූයේය. ඔහු සතුටු වෙන්නේ බිරිඳ හා දරුවන් තෘප්තියෙන් සිටින්නේ නම් පමණකි.

"ඔය ටික විතරක් කියලා දීලා මදි.. තමන්ගේ තාත්තා, සහෝදරයෝ දිහා ඇරෙන්න අනිත් පිරිමි දිහා ටිකක් සැකෙන්, අවිශ්වාසෙන් බලන විදියත් කියලා දෙන්න ඕනෑ.."

කිත්සිරි වෙතින් ඒ විස්තරය දැන ගත්තාට පසු ජීනාදරී කීවේ බැරෑරුම් ස්වරයෙනි.

"එච්චා කියලා දෙන්න ඕනෑ තාත්තා නෙවෙයි අම්මා.. හැබැයි දැන්ම කියලා ළමයින්ගෙ ළමා කාලය කාබාසිනියා කරලා දන්න ඕන නෑ.. ඒ කෙල්ල ඔහේ පාඩුවේ හැදිද්දෙන්.. ඕනෑ කෙනෙක් ආස්සරේ කරපුදෙන්.. වැරදි පැත්තකට යනවා කියලා දැනුණොත් විතරක් අවවාද කෙරුවම ඇති.." ඔහු තරයේම කීවේය.

සත්තකින්ම ඔවුන් තුළ තිබුණේ දරුවන් රජුන් හෝ රැජිනියන් කිරීමේ සිහින නොවේ. තමන් අභිමත ලෝක කරා යනු පිණිස දරුවන් ගේ සිතුම්පැතුම් වෙනස් කර ඔවුන් අසරණයන් බවට පත් කරන්නට ඔවුන්ට වුවමනා වූයේ ද නැත. ඔවුන්ට වුවමනා වූයේ කාටවත් අත නොපා, කිසිවෙකුට කරදරයක් නොකර ජීවත් වෙන ආකාරයට දරුවන් හදවඩා ගන්නට පමණකි. ඉනික්බිතිව යායුතු මංහසර ඔවුන් විසින්ම සොයා ගනු නියතයැයි අඹුසැමියෝ තරයේම විශ්වාස කළහ. කවදවත් කුසගින්නේ නොසිටියත් අගහිඟකම් තේරුම් ගන්නට ඔවුන්ගේ දරුවන්ට ශක්තිය තිබිණි. ඔවුන් දෙදෙනා ඔවුන්ට දෝත පුරාම දුන්නේ ආදරය හා රැකවරණය පමණකි.

"ජීනා.. මං උඹට තරහට නෙමෙයි මේ කියන්නෙ.. වැලේ ගෙඩි වැලට බර නෑ කිව්වට ගෙඩි ටික ටික ලොකු මහත් වෙද්දී, වැලේ හයිය අඩු වෙද්දී ඒ බර දැනෙන්න ගන්නවා.. අන්තිමට සිද්ද වෙන්නෙ වැලත් කැඩිලා ගෙඩි ටිකත් සීසීකඩ විසිරිලා යන එක.. පස්සෙ දුක් වෙනවට වැඩිය හොඳයි ටිකක් කල්පනාවෙන් වැඩ කරන එක.."

පසුද උදේ දිනේෂි සිය නිවසට කැටුව යාම පිණිස පැමිණි හීන් නෝනා කියාගෙන ගියේ කිත්සිරි අහළපහළ ඇද්දැයි සෝදිසියෙන් බලමිනි. ලේලිය රෝහලට යාමට සූදනම් වෙමින් සිටින මේ මොහොතේ පුතු සමඟ සිත් අමනාපයක් ඇති කර ගන්නට ඇය කැමති වූයේ නැත.

"අම්මා කියන්න හදන්නෙ මොකක්ද කියලා මට තේරෙන්නෙ නෑ.." ජීනාදරී නළලත රැළි කළාය.

"නොතේරෙන්න උඹ බබානෙ.. මේ සැරේවත් එනකොට ඔය දරුවෝ නැති වෙන්න කරන ඔපරේසම කරගෙන වරෙන්.. කිත්තට බරක්පතලක් නැති වුණාට උඹට තියෙන්ට එපායැ.. උඹ තිස්සදෙවේලේ බඩක් බැඳගෙන ඉන්නකොට අර හෙට අනිද්ද ගෙට වෙන්න ඉන්න එකීටත් ලජ්ජාවනෙ.. අනිත් එක තව ඉස්සරහට සුළුපටු වියදම් ද කරන්න තියෙන්නෙ..?"

හීන්නෝනා කියාගෙන ගියේ නොරිස්සුම පෙරදැරි කරගෙනය.

"ඔව් අම්මා.. මමත් හිතාගෙන ඉන්නෙ එහෙම තමයි.. මිඩ වයිෆ් නෝනත් කිව්වා මීට පස්සෙ දරුවො හදන එක අවදනම් කියලා.."

ජීනාදරී නැන්දම්මාට පමණක් ඇසෙන්නට පහත් හඬින් දෙඩුවාය. හීන් නෝනාගේ දෙතොලේ සැනසිලිදායක මඳහසක් ඇඳිණි.

ලබන සතියට.

විදෙස් ලොව

අපි ඉන්න ක්ෂීරපථයේ හැපෙන ඇන්ඩ්‍රොමීඩා මන්දාකිණිය

2012 දී නාසා ආයතනය කළ ගවේෂණයකදී ඇන්ඩ්‍රොමීඩා මන්දාකිණිය වසර බිලියන 4.5 කදී ක්ෂීර පථය හා ගැටෙන බව සොයාගෙන ඇත. එහෙත් වර්තමානයේදී ඇන්ඩ්‍රොමීඩා මන්දාකිණිය තත්පරයට කිලෝමීටර් 300ක වේගයෙන් ක්ෂීර පථය වෙත ළඟාවෙමින් ක්ෂීර පථය හා ගැටීමේ ක්‍රියාවලිය වේගවත්වී ඇති බව සොයාගෙන ඇත. එයින් අපගේ සෞරග්‍රහ මණ්ඩලයට බිහිසුණු සිද්ධියකට පත්වීමට ඉඩ ඇති බව විද්‍යාඥයින් පෙන්වාදී තිබේ.

ඇන්ඩ්‍රොමීඩා මන්දාකිණිය Messier 31, M31 හා NGC 224 ලෙසද හඳුන්වන අතර පෘථිවියේ සිට ආලෝක වර්ෂ මිලියන 2.537ක් දුරින් පිහිටා ඇත. නිසරු සර්පිලාකාර මන්දාකිණියක් ලෙස සලකන ඇන්ඩ්‍රොමීඩාවේ අරය ආලෝක වර්ෂ 110,000ක් වන අතර එහි ඇති තාරකා ප්‍රමාණය ට්‍රිලියන එකකි. ක්ෂීර පථයේ අරය අලෝක වර්ෂ 52,850 ක් වන අතර එහි ඇති තාරකා ප්‍රමාණය බිලියන 100-400 ත් අතර වේ. මන්දාකිණි ගැටුම ඉතා බියජනක සිද්ධියක් බව විද්‍යාඥයෝ සඳහන් කරති. ගැටුමෙන් නව තාරකා බිහිවන අතර ගුරුත්වාකර්ෂණ බලයද වෙනස්වී මන්දාකිණි නිර්මාණය වීමේ වනුහයද දැඩි වෙනසකට පත්වන බව පෙන්වා දී ඇත.

ඇන්ඩ්‍රොමීඩා හා ක්ෂීර පථය ගැටීම පිළිබඳව වූ පරේක්ෂණ පාදක කරගෙන ඇත්තේ හබල් අභ්‍යවකාශ දුරේක්ෂය මගින් ඇන්ඩ්‍රොමීඩා මන්දකිණිය අවට ඇති අවකාශය නිරීක්ෂණය කරන "ඇමිගා" ව්‍යාපෘතිය මගිනි. නාසා ආයතනය මෙම ව්‍යාපෘතිය හඳුන්වා ඇත්තේ "මන්දකිණිය අවට ඇති ප්‍රභා මණ්ඩල (Halo) අධ්‍යයනය" යනුවෙනි. "ඇස්ට්‍රොෆිසිකල් ජර්නල්" වාර්තාවෙන් පෙන්වා දෙන්නේ මන්දකිණි ගැටීමේ ක්‍රියාවලිය ආරම්භවී ඇති බවත් ඒවායේ ප්‍රභා මණ්ඩල එකිනෙකට ළංවීමට පටන්ගෙන ඇති බවත්ය. මන්දකිණියක ප්‍රභා මණ්ඩල විශාල වායු ස්ථරයකින් හා අභ්‍යවකාශ දූවිලිවලින් නිර්මාණය වී තිබේ. මන්දකිණියක සත්‍ය විශාලත්වය තීරණය වනුයේ ප්‍රභා මණ්ඩලය අනුවය. එහෙත් ඒවා ඉතා මලානික හා දුර්වර්ණ නිසා නිරීක්ෂණය කිරීම පහසු නොවේ. එහෙත් හබල් අභ්‍යවකාශ දුරේක්ෂය මගින් ඒවා නිවැරදිව සොයා ගැනීමට හැකිවී ඇත.

ඇන්ඩ්‍රොමීඩා හා ක්ෂීර පථය එකට ගැටීමෙන් මන්දකිණි මධ්‍යයේ සිට නව කක්ෂයක් බිහිවේ. 2012 ගවේෂණයට සහභාගි වූ විද්‍යාඥයින් ප්‍රකාශ කරනුයේ මන්දකිණි ගැටුමෙන් අපගේ සෞරග්‍රහ මණ්ඩලය නව ප්‍රදේශයකට විසිවෙන බවය. එහෙත් අපගේ පෘථිවිය ඇතුළු සෞරග්‍රහ මණ්ඩලය විනාශවී යාමේ අවදනමක් වර්තමානයේදී නැති බවද එම ක්‍රියාවලිය සිදුවීමට තවත් වසර බිලියන 2.5 ක් ගතවෙන බවද සඳහන් කර තිබේ. එතෙක් අපේ සෞරග්‍රහ මණ්ඩලය සුරැකෙන බව ඔවුන්ගේ විශ්වාසයයි. ඉන්පසුව අපගේ පෘථිවියට මුහුණදීමට සිදුවනුයේ අභාග්‍යසම්පන්න කාල පරිච්ඡේදයකටය. නව සෞරග්‍රහ මණ්ඩල ක්‍රියා පිළිවෙලේ පිහිටීම අනුව අවට පිහිටි තාරකාවල දැඩි විකිරණවලට නිරාවරණය වීමෙන් සැප විහරණ නොලැබෙන දැඩි උෂ්ණත්වයකට මුහුණ දීමට පෘථිවියට සිදුවේ, අපගේ පෘථිවිය ගුරුත්වාකර්ෂණ උගුලකට හසුවීමෙන් කාලගුණ විපර්යාසයන්ට හා පෘථිවි ජීවිත දැඩි අවදනමකට ලක්වන බවද සඳහන් කර තිබේ.

(තොරතුරු අන්තර්ජාලයෙනි)

පී. ඩබ්ලිව්. ගුණතිලක

ලංකාදීප රසවිත

කෙටි කතාව



හඳුනාගනිමු

කෙමෙන් කෙමෙන් අප්පච්චිගේ දුෂ්කර සේවා කාලය අවසන් වූයේ අපේ හිත්වලට සහනයක් උදාකර දෙමින්ය. කිව්වත් වාගේ හෙතෙම ගමේ පාසලේ විදුහල්පති වූයේය. ඉස්සර හිටි ගෝල බාලයෝ ගමට අල්ලපු පාසලේම සේවය කළෝය. එතෙක් එය රජයට පවරා නොතිබුණි. 'වැව් පන්තිය' නමින් හැඳින්වූ ඒ පාසලට යා යුතු වූයේ කළපුවෙන් එගොඩ වීමෙන්ය.

"බරිගම වෙදරාළ' යනුවෙන් අප්පච්චිට නමක් පටබැඳී තිබුණේ ඔහු තරුණ කාලයේ ඒ නාට්‍යයේ රඟපෑ නිසාලු. හෙතෙම විනෝදයට, කතාවට මෙන්ම පරෝපකාරයටද සමත් අයෙක් වූයේය. වෘත්තියෙන් ගුරුවරයකු වූ අප්පච්චි රාජකාරි කාලයෙන් බැහැර වූ වේලාවල වත්තපිටිය කුඹුරුවල වැඩ කිරීමට අලස නොවී සිටියේය. කොණ්ඩය කොටට කපා, උඩුරුවුලෙන් යුක්තව සුදෝසුදු ජාතික ඇඳුම ඇඳගෙන ඈත සිට ඔහු එනවිට ගාම්භීර විලාසයක් මතුවෙයි.

''ආර ඉරෝ...'' ඔහු කියයි.

''සේන් සේන්...'' ළමයි කියති.

''දුවලා දුවලා ගිහින් තුන්වැනි පන්තියේ කළු ලෑල්ලේ ලස්සනට 'ර' යන්න ලියල එන්න.'' ඔහුගේ ආඥාදායක ස්වරූපය මුළු පන්තිය පුරාම රැව්දෙයි. එහෙත් එය කාරුණිකය. අපි එකිනෙකා පරයා ඒ පන්ති කාමරයට දුව යමු. මේ කඩා පැන්න හමුදාව දෙස ඒ ගුරුතුමිය හා ළමයි ද මවිතයෙන් යුතුව බලා සිටිති.

තුන්වැනි පන්තිය භාර ගුරුතුමිය මගේ අම්මා ය. හිස්ව තිබූ කළුලෑල්ලේ ලියැවුණ 'ර' අකුරු මැද වටකුරුවට බඳ මහතට ලියවුණ මගේ 'ර' යන්න ඉස්මතු වී පෙනෙයි.

''හැබෑටම ඉස්කෝලෙ හාමිනේ, මේ 'රයන්න' කාගෙද?''

විදුහල්පතිතුමා එසේ පවසන විට අම්මා දෙතොල් අතරින් සිනා නඟනවා මිස පිළිතුරක් නොදෙන්නීය. වේවැල අතට ගන්නා නමුදු අප්පච්චි කුඩා දරුවකු වගේය. එනමුදු පෙනුමෙන් ප්‍රතාපවත්ය. සවස් කාලයේ ඔහුට ඇති වැඩ රාජකාරි බොහෝ වෙයි. දුරින් පිහිටි වැට මායිමේ හරක් පැන්න තැන් අලුතින් ඉනි සිටුවා සකස් කරයි. බෝගවලට ජලය හා පොහොර දමා ඒවා අතගා බලයි. මේ අතර ගමේ පාසලේ සිට තනතුර උසස්වීමෙන් පසු ඔහු දුෂ්කර පළාතට අනුයුක්ත කෙරිණි.

''ඉස්කෝලෙ මහත්තයට අයියනායක දෙයියන්ගෙ පිහිටයි.''

ඉහළ පුලියන්කුලම රජයේ පාසලට ඔහු මාරුවී යනවිට ගම්මුන් ආශිර්වාද කළේ එසේ කියමිනි. ඒ පාසල ගණ කැලෑවක් මැද, අලි රංචු නිතර සැරිසරන, සර්පයන් බහුල පෙදෙසක පිහිටියේය.

ගම්වැසියෝ කෑම බීම, පලතුරු ආදිය ද ඔහුට පිරිනැමූහ.

''උන්නාන්සෙ අපට දෙයියෙක් වාගේ. අපි ඇහැක් වාගේ බලාගන්නම්. නෝන මහත්තයා විස්සෝප වෙන්ට එපා!''

මුල් දවසේ ගම්වැසියන් අම්මා අස්වැසුයේ එසේ පවසමින්ය. අම්මා ඒ මොහොතේ ඇගේ කරෙන් පහළට දමා තිබූ සුදු මල් වැටුණ තුනහුලස් ඔසරිපටින් කඳුළු පිස දමා ගත්තාය. අප්පච්චි නැවතී සිටියේ ගුරු නිවාසයේය. ගත වූ සතියක දී ද එහි වහලයෙන් දැවැන්ත මාපිලෙක් බිමට වැටුණ බව ඔහු පැවසුයේය. ඒ භීතිය දනවන පුවත අසා අපි කම්පා වූයෙමු.

කෙමෙන් කෙමෙන් අප්පච්චිගේ දුෂ්කර සේවා කාලය අවසන් වූයේ අපේ හිත්වලට සහනයක් උදාකර දෙමින්ය. කිව්වත් වාගේ හෙතෙම ගමේ පාසලේ විදුහල්පති වූයේය. ඉස්සර හිටි ගෝල බාලයෝ ගමට අල්ලපු පාසලේම සේවය කළෝය. එතෙක් එය රජයට පවරා නොතිබුණි. 'වැව් පන්තිය' නමින් හැඳින්වූ ඒ පාසලට යා යුතු වූයේ කළපුවෙන් එගොඩ වීමෙන්ය. එය තරණය කර එහි යා යුතුය. ගුරුවරු දෙදෙනා තනමත්තක් දියට බැස ඉන් එගොඩ වී යළිත් ඇඳුම් ඇඳගෙන ඒ පාසලට ගමන් කරති. එසේ වනුයේ වර්ෂා කාලයට එය පිටාර ගලා යන බැවින්ය. ධීවර ජනතාව මේ අවට පදිංචි වී සිටින නිසා බොහෝ සිසු දරුවෝ ඒ ගම්මානවලින් පැමිණෙන අය වූහ. අප්පච්චි රජයේ පාසලේ වැඩ කළ නමුදු මේ පාසලද රජයට පවරා ගැනීම සඳහා අප්පච්චි බොහෝ ඇප කැපවී වැඩ කර දුන්නේය. ඔහු ඒ සඳහා මූලිකත්වය දැරුවේය.

ඒ කාලයේ පාසලට අනුයුක්ත වී සිටි හැමදෙනාගේම වැටුපද මේ නිසා ඉහළ මට්ටමකට පිවිසියේය. සාමදන විනිසුරුවරයකු ද පොලිස් නඩු විභාග කරන්නෙකුද දනම් පාසල් විදුහල්පතිවරයකුද ලෙස සේවය කළ හෙතෙම 'වැව් පන්තිය' පාසල රජයට පවරා ගැනීමේ උත්සවයේ දී ප්‍රධාන ආරාධිතයා වූයේය.

කාලය ගෙවී ගියේ ඉතා ඉක්මනින්ය. ලොකු මහත් වී ඉගෙනුම හමාර කළ පසු මා ද අගනුවරට නුදුරුව පදිංචි වූයේ අපේ අවශ්‍යතාවලට අනුකූලවය.

මහගෙදර බලා කියා ගැනීම, හිතේෂිවන්තයකුට පවරා අප්පච්චි හා අම්මා මා සමග පදිංචියට ආවෝය.

''පුතේ, මට ආසයි ගම්පැත්තේ ගිහින් රවුමක් ඇවිදලා එන්න.''

හිතේ සිරකරගෙන සිටි දෙළඳුක ගැන අප්පච්චි මා සමග පැවසුවේය. වරින්වර අප ගමට ගිය නමුදු නිවසින් පිටස්තර තැන්වලට යාමට ඉඩක් නොලැබුණි. දරුවෝ ද බිරිඳ ද මෙයට එකපයින්ම කැමැත්ත පළ කළහ.

''පුතේ, ඔයාලගේ ආතලගේ මහගෙදර ළඟ තමයි 'කුරුලු උයන' තියෙන්නේ. වැව් පහක්ම එක යාංගෙට තියනව. කුඹුරු තියනවා. මෙද පාරනම් ඒ පැත්තෙන් ගිහින් එන්නෝනැ.''

ආහාර ද පිළියෙල කරගෙන අප ආ බව ආරංචි වූ ගමේ හිතවත් පිරිසද අප බැහැදැකීමට පැමිණියෝය.

''ගමේ ඉස්කෝලෙ නම් වැහිලම ගියා. ඒක දැන් ආණ්ඩුවේ මධ්‍යස්ථානයකට අරගෙන. වැව් පන්තිය ඉස්කෝලෙ නම් හරි දියුණුයිලු. කොළඹින් ආව ගුරු මහත්තුරු ඒ ඉස්කෝලේ දියුණු කරලා අරගෙනලු. ළමයිනුත් හොඳට පාස්වෙනවලු.''

ගමේ විස්තර අසා සිටිය අප්පච්චි එක්වරම ප්‍රාණවත් වූයේය.

''මටත් ආසයි ඉස්කෝලෙ බලල එන්න. ඔය ඉස්කෝලෙ ආණ්ඩුවට පවරන්න මාත් ඒ අයට උදවු කළා.''

''කවුද ඒක නොදන්නෙ. අපේ ඉස්කෝලේ මහත්තය දැඳුරු ඔයෙන් එගොඩ රජෙක් වගෙයිනෙ හිටියෙ.'' හැමෝම එසේ පැවසූහ.

එද පාසල පැවැත්වූ දිනයකි. පළමුව පාසලට ගොස් මුහුදු රැල්ල පාගා අනතුරුව කුරුලු උයන නැරඹීම අපේ අදහස විය. අපි පාසල අසල මාර්ගය අයිනේ රථය නතර කළෙමු.

''අප්පච්චි යන්න. අපි මෙහේ ඉන්නම්. දැන් ඔය ඉස්කෝලවල රෙගුලාසි හරියට.''

අපි වාහනය තුළට වී සිටියෙමු. අප්පච්චි කලින් අපට කියා තිබූ හැටියට වෙනද වගේ නම් පාරක් තොටක් නොපෙනෙන තරමට දිය පහර ගලා යන්නේය. ඒත් දැන් අලංකාර ලෙස පාලමක් තනා ඇත. නිල ඇඳුමෙන් සැරසුණු මුරකරු වහා අප ඉදිරියට දිව ආවේය.

''කොහෙද මේ යන්නෙ?''

ඔහුගේ හඬ ගොරහැඩිය. දැවැන්ත ගේට්ටුවද වසා දමා ඇත.

''මං ආවෙ...''

අප්පච්චි ඔහු අමතා යමක් පවසන්නට උත්සාහ කළේ එකෙල මෙකෙල වෙමින්ය.

''අද අඟහරුවාද. ප්‍රින්සිපල් සර් මුණගැහෙන්න පුළුවන් බදාදට විතරයි. මහත්තයා ගිහින් හෙට එන්න.''

අප්පච්චිට දැන් කෙළින් සිටගැනීමට පවා අපහසුය. ඔහුට මුරකරු හා දෙඩීමට අපහසු බවද හැඟේ.

''මේ ඉන්නේ මගේ අප්පච්චි. එයා තමයි මේ ඉස්කෝලෙ රජයට පවරන්න මූලික වෙලා හිටියෙ.''

ඇතුළේ සිට ආ තවත් අයකු අපව පාසල් භූමිය තුළට කැඳවාගත් නමුදු වාඩිවීමට සිදුවූයේ මිදුලේ තබා තිබූ පුටුවලය. විදුහල්පතිවරයා ටයි එකක් පැළඳ සුදෝසුදු කබායෙන් හා කලිසමෙන් සැරසී ගරු ගාම්භීර තාලයට රථයේ නැගී පාසල් භූමියෙන් පිටත්වී ගියේය. එනමුදු රැස්වූ අය දෙස ඉතා කුලුපහ ලෙස සිනාසී යාමට අමතක නොකළේය. සීනුව නාදවත්ම ගුරුවරු පන්ති මාරුවී යන්නේ මුණගැහෙන තත්පරයේදී වුව සිනහ මුහුණක් පාමින්ය.

අප මුහුණලා සිටියේ විදුහල්පති කාර්යාලයට ඉදිරියෙන්ය. කිසිවකු විසින් අප්පච්චිව ගණන් ගත් බවක් දක්නට නොලැබුණි.

ඉර මුදුන් වෙලාය. අප එළියේ වාඩිවී සිටි තැනට සැඩ හිරු කිරණ පතිත වනුයේ අනුකම්පාව බිඳකුදු නැතිවා සේය.

''අප්පච්චි අපි යමු. ආයෙ වෙන දවසක එන්ට බැරියැ. දැන් ඉස්කෝලේ දැකලවත් සතුටු වුණානෙ.''

''ඔව් පුතේ, අපි එහෙම කරමු.'' හෙතෙම අමාරුවෙන් යුතුව රථයට නැංගේය.

''ඔය ඇත්තන්ට කලින්ම කීවනේ අද ප්‍රින්සිපල් සර් හමුවෙන්න බැහැ කියලා.''

රථයේ ඉදිරි අසුනේ වාඩිවී සිටි අප්පච්චිගේ දෑස රැඳී තිබුණේ පාසල් ගොඩනැගිල්ල වෙතය.

''මේක අප්පච්චි උගන්නපු ඉස්කෝලෙත් නෙවෙයි. ඉතින් මොකටද වදවෙන්නෙ. ඒක නෙවෙයි. ඇතුළෙ අප්පච්චිගෙ පොටෝ එක ගහල තිබුණ.''

''ඇත්තද පුතේ. පුතා දැක්කද?''

හෙතෙම මහත් කලබලයෙන් යුතුව පැවසුවේය. ඔහුගේ හිසේ මල් පිපුණා සේය.

''ඔව් අප්පච්චි, මම වටයක් කැරකිලා ආවනෙ.''

වැව් යංගෙම පසුකර යන තුරාම ඔහුගේ මුහුණේ පැහැපත් බව රැඳී තිබෙන අයුරු මම දුටුවෙමි.

''පොටෝ ගහල වැඩක් තියනවයැ ඒ මනුස්සයට පිළිගැනීමක් නැත්නම්. නේද දුවේ?''

අම්මා මගේ බිරිඳ දෙස බලා හෙමින් පවසා නිහඬ වූවාය.

පියසීලි විජේනායක

> "හැබෑටම ඉස්කෝලෙ හාමිනේ, මේ 'රයන්න' කාගෙද?"
>
> විදුහල්පතිතුමා එසේ පවසන විට අම්මා දෙතොල් අතරින් සිනා නඟනවා මිස පිළිතුරක් නොදෙන්නීය. වේවැල අතට ගන්නා නමුදු අප්පච්චි කුඩා දරුවකු වගේය. එනමුදු පෙනුමෙන් ප්‍රතාපවත්ය. සවස් කාලයේ ඔහුට ඇති වැඩ රාජකාරි බොහෝ වෙයි.

විශ්ව සාහිත්‍යයෙන්

දෙවිලොව සිට ගලා එන සාහිත්‍ය අමා ගංගාව

සාහිත්‍යය නම් අම මී ගඟුල ලොවට බිහිවූයේ කෙසේ ද? එය උපත ලද ස්ථානය සොයා දැනගන්නට නම් දෙවිලොව යන්නට සිදුවේ. ලොව මුලින්ම බිහිවූ කවි ගී කතන්දර සියල්ලටම පාහේ දෙවියන් සම්බන්ධ වීම ඊට හේතුවයි.

විදු නැණින් තහවුරු කොට ඇති පරිදි, අපි දිගු වලිග ඇතිව රුක් මුදුන්හි වාසය කළ වානර කණ්ඩායමකින් පැවතෙන්නෝ වෙමු. පසුව වානර මානවයකු වී ඔස්ට්‍රලෝපිතිකස්, රැඩල්පෙන්සීස්, හැබිලස්, ඉරෙක්ටස්, නියැන්ඩර්තාල් ආදී ස්වරූප පසුකරමින් හෝමෝ සේපියන් නම් වර්තමාන තත්ත්වයට පැමිණීමට අපට ගතවූ කාලය වසර ලක්ෂ පනහකට ආසන්නය.

ඉරෙක්ටස් මානවයන් ලෝකයේ මුල්ම කලාකාමීන් බවට සාධක හමුවී ඇත. ඔහුගේ මොළය වත්මන් ප්‍රමාණයෙන් අඩක් වුවද, මූලික ජීව හැඟීම් අභිභවා නිර්මාණාත්මක සංවේදනාවන් එහි ජනිත විය. තමන් පරිහරණය කළ උපකරණවලට පවා අලුත් රුවක් දුන්නේ ඒ නිසයි.

වසර ලක්ෂ දෙකක සිට මිහිමත වසන හෝමෝ සේපියන් මානවයෝ සත්ව ඇටවලින් ඉදිකටු තනා සම් ඇඳුම් ඇඟලා, සත්ව දත් - නිය පැළඳ, ගුරුගල්වලින් තම සිරුර ද අලංකාර කරගත්තෝය. මොවුහු හැඟීම් දරන්නෝය. සිහින දකින්නෝය. අත්පොළසන් නදින් මුල පුරා සංගීතයත් නැටුමත් ඔවුහු සොයාගත්හ. නොපෙනෙන බලවේග යදිමින් කවි ගී කතන්දර ද ගොඩනැගුවෝය.

නයිල් ගඟ බඩ ගොවි ගම්මාන ඇරඹුණේ ක්‍රි. පූ. 6000 දීය. ඉන් මද කලකට පසු යුප්‍රටීස් - ටයිග්‍රීස් දෙගංමැදි ශිෂ්ටාචාරය ඇරඹිණි. මැටිපොත්වල රූපාක්ෂරයෙන් ඔවුන් තැබූ සටහන් මුල දී ගණන් හිලව් තැබීම, දැනුම ගබඩා කිරීම ආදී කාරණාවලට සීමා වුවත් පසුව නිර්මාණාත්මක සංකල්ප ද ඒවායේ ලියැවෙන්නට පටන් ගත්තේය.

නයිල් ඉවුරේ ගොවි ජනතාව රූපාක්ෂර කලාවේ මහත් විප්ලවයක් සිදුකළේ ලොව මුල්ම කඩදාසි වර්ගය සොයාගැනීමෙනි. ගං ඉවුරුවල සරුවට වැඩුණු පැපිරස් නම් බට විශේෂය ඊට එකම අමුද්‍රව්‍යය විය. සුදු පැහැති මෘදු මෙහි බඩය තීරු කපා තෙත පිටින්ම ලෑල්ලක් මත අතුරනු ලැබේ. ඊට උඩින් තවත් තීරු අතුරන්නේ පොල්අතු වියන ආකාරයට එකිනෙක සම්බන්ධ කරමිනි. ඉන්පසු එය මිටියකින් කළා, ලී රෝලකින් තුනී කරනු ලැබේ. එය වියලාගත් විට විශාල ප්‍රමාණයේ පැපිරස් කඩදාසියක් නොහොත් 'පේපර්' එකකි.

ප්‍රථම ලිඛිත සාහිත්‍යය ඇරඹුණේ මිසරයෙනි. ඒවා නම් පැපිරස් පත්‍රවල සටහන් වූ දේව කතන්දරය. අයිසීස්, ඔසිරිස්, හෝරස් ආදී මිසර දේව පරපුර නියෝජනය කෙරෙන මෙම නිර්මාණ ක්‍රි.පූ. 2000ට පෙර බිහිවූ බව පිළිගැනේ.

දෙවියන් ආශ්‍රිත කතන්දර කලාව මිසරයට පමණක් සීමා වූයේ නැත. මෙසපොතේමියාව, චීනය, ග්‍රීසිය සහ භාරතය ද සාහිත්‍යය නම් අමිල මිණ දෙවියන් වෙතින්ම ලබාගත්තේ ඊට සමීප කාල වකවානුවක දීය.

මෙසපොතේමියාවේ හිටපු පාලකයකු යැයි සැලකෙන ගිල්ගමේෂ් රජු වටා ගෙතුණු රසවත් පුරාවෘත්තයක් ද මේ සමයේ ලේඛනගත විය. ඒ කතාවට අනුව ගිල්ගමේෂ් රජු අමරණීයත්වය ලබාදෙන ඔසු පැළැටියක් සොයා යයි. එය ඇත්තේ සාගර පතුළේය. වීර චාරිකාවකින් පසුව ගිල්ගමේෂ් ඔසුව සොයාගන්නා නමුත්, විශාල සර්පයෙක් එය උදුරාගනී.

මධ්‍යධරණී මුහුද මේ සාගර තටාකයේ, දූපත් රාශියක් පිරිවරා ගනිමින් මුහුදට නෙරා ගිය ගොඩබිම ග්‍රීසියයි. ගිරිහෙල්, ආගාධ, මිටියාවත්වලින් පිරුණු මෙම භූමියේ වාර්ගිකව බෙදුණු ගෝත්‍ර රාශියක් විසූහ. මෙම දේශයට දියුණුව ගෙන ආවේ බැහැරින් ආ ආර්ය නම් ජන සමූහයකි. මධ්‍යම ආසියාවේ සිට තම සතුන් දක්කාගෙන කෙම් බිම් සොයා පහළට පැමිණි ආර්යයෝ දෙකොටසකට බෙදී මධ්‍යධරණී දෙසටත් භාරතය දෙසටත් ගියහ. අවසානයේ ඒ දෙපැත්තම ඔවුන්ගේ ආධිපත්‍යයට නතු විය.

ආර්යයෝ ආගමක් ඇදහූ එඬේර ජනතාවකි. 'අග්නිය' ඔවුන්ගේ ආගමේ මුල්තැන ගති. ආර්ය ජනකැල මෙහෙය වූ එඬේරුන් වූයේ බුද්ධිමත් පූජක පිරිසකි. ග්‍රීසියට ආ මොවුහු එහි සිටි ස්වදේශිකයන්ට ද මග පෙන්වමින් වසර පන්සියයක් තුළ රාජ්‍ය ලෙස සංවිධානය වීමට ද සමත් වූහ.

ආර්යයෝ ලෝකයට වැඩිම බලපෑමක් කළ පිරිසකි. මේ පැහැපත් මිනිස් කණ්ඩායම ග්‍රීක ශිෂ්ටාචාරය ඇති කරමින් යුරෝපා ජාතීන්ට උපත දුන්හ. එලෙසින්ම ඉන්දු නිම්නයට පැමිණ භාරතය නම් අභිමානවත් දේශය ද බිහිකළෝය.

ග්‍රීසිය මෙන්ම භාරතයේ ද ආගමික ව්‍යුහය එක සමානය. ස්වභාව ධර්මයේ ජීවමාන වස්තූන් වන ඉර - හඳ - තාරකා - ග්‍රහලෝක ද ගින්න - සුළඟ - ජලය සහ කාලගුණය ද දෙවියන් බවට හරවා අපූරු කතන්දර මාලාවකින් ඒවා සාහිත්‍යමය චරිත බවට පත්කර තිබේ. ඉන්ද්‍ර, වරුණ යම ආදී ලෙසින් හැඳින්වෙන භාරතීය දේව පරපුර ග්‍රීසියේ දී සියුස්, පොසීඩන්, හේඩීස් ආදී නමින් පෙනී සිටිති. ඔවුහු බොහෝ විට මිනිස් හැඟීම් සහ ක්‍රියාකාරකම්වලින් යුක්ත වූහ.

ග්‍රීක දෙවිවරුන්ගේ විමානය පිහිටියේ ඔලිම්පස් කන්දේය. එය තුර්කිය සහ ග්‍රීසිය හරහා වැටී ඇති ජීවමාන කඳුවැටියකි. දෙවිවරු විශ්වය නිර්මාණය කළ බවක් නොඇදහූ ග්‍රීකයෝ විශ්වය විසින් දෙවියෝ නිර්මිත බව විශ්වාස කළහ. ඒ නිසා ඔවුහු දෙවියන් කෙරේ අධික බියක් නොදැක්වූහ. දෙවියන් ගැන සිනහ පහළ කිරීමට වුවත් ඔවුන්ට නිදහස තිබුණි.

ග්‍රීක දෙවිවරු මිනිස් රැවින්ද, මිනිස් ගුණයෙන් ද යුක්තෝය. ඔලිම්පස් කන්දේ සිට දෙවිලොව සහ මනුලොවත් බලාගත්තේ සියුස් නම් මහ දෙවියාය. ආකාශයට සහ කාලගුණයට අධිපති වූ ඔහුගේ අතෙහි අකුණු සරයක් විය. මනු ලොව රූබරියන් කෙරෙහි පවා නිතර අනුරාගයෙන් සිටි සල්ලාලයෙකි. හේරා නම්වූ ඔහුගේ බිරිය විවාහය සහ දරුවන් පිළිබඳ අධිපතිකම් දැරීම නිසා කතන්දර රාශියකට මේ දෙදෙනා මැදිව සිටිති.

සියුස්ට සොහොයුරන් දෙදෙනෙකි. පොසීඩන් නම් වූ එක් අයෙක් සාගරය, කුණාටු සහ භූමි කම්පා මෙහෙය වීය. හේඩීස් නම් අනෙක් සොහොයුරා යම ලොවට ලොක්කා විය. සියුස්ට දරුවන් රැසක් සිටි අතර ඉන් හය දෙනෙක්ම මහ තනතුරු දැරූ හෙයින් දෙව්ලොව පැවතියේ ද 'පවුල් පාලනය'කි.

පියාගේ හිස පලාගෙන උපන් ඇතීනා බුද්ධිය - දැනුම - අත්කම් - ගොවිකම් නියෝජනය කළාය. ඇපොලෝ සංගීතය, ධනු ශිල්පය සහ වෙදකමට අධිපති විය. සියුස්ගේ තවත් පුතකු වන හර්මීස් දෙව්ලොව පණිවුඩකරුවාය. හිස්වැසුමේ සහ පාවහන්වල පියාපත් ඇති ඔහු එඬේරුන්ගේ, වෙළෙඳුන්ගේ සහ හොරුන්ගේ ද ආරක්ෂකයාය. ඒරීස් අඟහරු ග්‍රහයා නිරූපනය කරමින් සංග්‍රාමයට අධිපති විය. දඩයමට සහ රාත්‍රියට අධිපතිනිය වූ ආර්ටිමිස්ට රිදී ගෝනුන් බැඳි සිය රථයෙන් සඳ ඇදගෙන යාමද පැවරී තිබිණ.

දෙව්ලොව විශ්වකර්මයා වූයේ ගින්දරට, ලෝහයට අධිපති වූ විරූපී හෙපස්ටස්ය. ඔහුගේ බිරිය ආලයට, සුන්දරත්වයට අධිපතිනිය වූද, දෙව්ලොව අග්‍ර සුරැපිනිය වූද ඇප්‍රොඩයිට් වීම අපූරු එක්වීමකි. ආදරවන්තයින් එක් කරන ඊරෝස්, සුරාවට ලොක්කා වූ ඩයනීසස් ආදී තවත් බොහෝ දෙව්වරුන් මහා සාහිත්‍ය ප්‍රවාහයක චරිත ලෙසින් අද දක්වාත් ජීවමානය.

භාරත දේව මණ්ඩලය ද නොයෙක් කයිකතන්දරවලට මැදිවූ පිරිසකි. රූපකායෙන් ඇතැම් විට වෙනස්වන නමුත් මිනිසුන් මෙන්ම හැසිරෙන හොඳ මෙන්ම නරක ද යහමින් ඇති දේව කුටුම්බයක් ලෙස හඳුනාගත හැකිය.

හින්දු දේව පුරාණයට අනුව ලොව බලගතුම දෙවියා වූයේ, එය මැවූ මහා බ්‍රහ්මයාමයි. ලෝකය සුරකින විෂ්ණු සහ විනාශ කරන්නාවූ ඊශ්වර ද එක්වූ කල 'ත්‍රිමූර්තිය' ලෙස ඔවුන් හැඳින් වේ.

මහබඹුගේ බිරිය වූ සරස්වතිය ද ඔහුම මවාගත්තේය. තවුස් වෙසින් සිටින ඊශ්වර නොහොත් ශිවගේ නළල මැද තුන්වැනි ඇසක් ද වෙයි. උමා නොහොත් පාර්වතිය ද ඇයගේ සොයුරිය ගංගා ද ඔහුගේ භාර්යාවෝය. නුවණට අධිපති ගනේෂ සහ යුදයට හපන් කාර්තිකේය ශිව - උමා දෙපළගේ දරුවන් ලෙස සැලකේ.

සදෙව් ලොවට අධිපති ශක්‍ර, ලොව එළිය කරන ඉන්ද්‍ර, ධනයට අධිපති කුවේර, නිර්මාණ ශිල්පී විශ්වකර්ම, අපායට ලොක්කා වූ යම ආදී ලෙසින් නොයෙකුත් බලතල දැරූ දෙවිවරු බොහෝ ගණනකි. මේ අතර මල්සර ද විශේෂ අයකු විය.

මොහුගේ රාජකාරිය වූයේ, මිනිස් ලොව හෝ දෙව් ලොව වේවා ස්ත්‍රී පුරුෂයන් සම්බන්ධ කිරීමයි. සිය උක්දඬු දුන්න ගෙන, බිඟුන්ගෙන් සැදි දුනුදිය ඇද දැසමන් ආදි මල් හී වර්ග පහෙන් එකක් යවා හදවත් දෙකක් යා කිරීම ඔහුට මහත් විනෝදයකි. එහෙත් ඔහුට වැරදුණේ භාවනායෝගීව සිටි ශිවට මල් හීයක් යැවූදය. කෝප වූ ඊශ්වරයා තම නළලෙහි වූ තුන්වැනි ඇස විවර කොට අග්නි සරයක් එවීය. එයින් සිරුර ද, ගිය මල්සර, ඉන්පසු සිරුරක් නැත්තා වූ 'අනංග' නම් විය.

දෙව්ලොව ඍෂිවරු ද සිටියහ. මහබඹුගේ පුතකු වූ නාරද ඍෂිවරයා දේව සභාවේ පිළිගත් සංගීතඥයෙකි. වාශිෂ්ඨ, විශ්වමිත්‍ර, දුර්වාස ආදී ඉසිවරු ඇතැම් විට දෙවියන්ට පවා අභියෝගයක් විය. මොවුන්ගේ කියුම් කෙරුම් වසර දහස් ගණනක් ඉදිරියට ඇදී එන සාහිත්‍ය ගංගාවකට උල්පත් වූයේය.

රන්ජිත් ප්‍රිය



තුදුහුණට සීගිරිය සොයා දුන් රන්තුක

ගෝබිස්ට දැන් වෙහෙසය. වෙහෙස අතරින් දැඩි කුසගින්නක්ද නැඟ එයි. තමා පැමිණ ඇති දිසාව කුමක් විය යුතුදැයි ඔහු සිතුවේය. සිතා බලන්නට බැරි තරම් අයස්කාන්තය. මනහර දිය විලක් වසා සුපිපි නිලුපුල් මල් කන්දරාවට ගෝබිස්ගේ සිත හිනා නැඟුවේය. වෙහෙස නිවා ගන්නට ඔහු අශ්වයා පිටින් බැස ගනී. අශ්වයා දිගැලි කොට දිය විලට පා නැඟුවේය. මල් යාය මෑත්කර දිය දෝතක් ගෙන පවස නිවා ගති. හාම්පුතුගේ ඉරියව්වටම අශ්වයාද විත් නිලුපුල් විලේ දිය බීගෙන බීගෙන ගියේය. දිය පහසින් වෙහෙස නිවුණි. විල් දිය අද්දර මහ සියඹලාවේ හේත්තුව නෙත් විහිදූ අහස බැලීය. ගෝබිස් දුටුවේ බ්‍රාහ්මණ රාජාලියන් අහස වටා කරණම් ගහන දසුනය. අහසින් ඇස් ගත් ඔහුට ඉමක් කොනක් නොපෙනෙන වනාන්තරය දිස්වේ. කුසගිනි දළුව යළි උදරය මැදින් නැඟ එන විට ගෝබිස්ට සිහිවූයේ දඩමසක රස බලන්නටය. දඩමස රස බලන්න මත්තෙන් ඔහුගේ මල්ලේ තිබූ අවසන් විස්කෝතු ටින් එක ඇර විස්කෝතු දෙක තුනක් කා කුසගින්නට විරාමයක් දුන්නේය. ගෝබිස් තුවක්කු බඳ අතට ගෙන හැරෙත්ම දුටුවේ ගෝනෙකු පසුපස දුවන අමුතු කොලු ගැටයාය. ගැටයා නැවතුනි. ගෝනා දිව ගියේය. සුදු හූරා දැක වැදි කොලුවා තැති ගත් දෑසින් බලා හිඳී. වැදි කොලුවා දුටු සුදු හූරා විමතිව බලමින් සිට වහා තුවක්කුව ගෙන ගිනි බින්දේය. දුව ගිය ගෝනාගේ බඳ මැදට වෙඩි වැදී ඌ විසිවී ඇද වැටුණේය. රන්තුක තැති ගෙනය.

මේ එක්දහස් අටසිය තිස් තුනේ ඔක්තෝබර් මහේය. බිනර මල් කඳු ඉහැත්තේ පිපෙන කාලයට මී පැණි මෝරයි. ඒ කාලයට ගෝනන් දඬේලාගෙන එන්නට ලකේ කන්දේ තනේගල වැදි ගැටව් දඩමඟුලට තැන්නට බහී. තැන්නේ දුටු නාඹර ගෝනා පසු පසින් ආ රන්තුක මේජර් ෆෝබිස්ගේ දෑස් ළඟ නතරව තාමත් බලාහිටී. මේ අමුතු දෑස් ඇති හිරිමල් වැදි ගැටයා දෙස බලා ෆෝබිස් හිනැහුනේය. රන්තුක විමතිය පහ කර දෑස් නඟා හිනා නැඟුවේය.

උඹ..... !
ර...න්...තු....ක...!!
රාන්තුක !
ර..න්..තු...ක
රන්තුක
ර..න්...තුක
රන්තුක

ෆෝබිස් රන්තුකගේ නම හරියටම ශබ්ද නැඟූ විට සතුටු වී හිනාවිය. කොලු ගැටයාගේ දසන් මල් හිනාවට ෆෝබිස් ද හිනා නැඟුවේ ඒ කිරි සුදටය.

ම..ම... ෆෝබිස්
හොබස් !
ෆෝබිස්
පෝබාස්
ෆෝබිස්
පෝ..බා..ස්...

ෆෝබිස් රන්තුකට පෝබාස් හූරාමය. මහ සියඹලාවේ යටට වී දෙන්නා ගෝනා එලාගෙන දඩමස් වින්දේය. මේජර් ෆෝබිස් රන්තුකගේ දඩමැඟි ගිනියම දෙස බලමින් තුටු විදිමින් දන්නා වදන්ද නොදන්නා ඉඟි බිඟිවලින්ද කාලය ගෙවා දැම්මේය. රන්තරු මාල බැඳන් අහස කළුවර තුනී කරයි. වියළි සුළඟ එක විටම හීතලක දැවටේ. රන්තුක ගෝන හම උඩින් සියඹලා කොළ ගොඩ ගැසුවේය. ඒ මතට ගිනි පුළිඟක් තබා ගිනි දැම්මේය. ගෝන හමේ මසින් වෙන්වූ පැත්ත පිළිස්සුවේය. සියඹලා කොළ සුවඳට අමුතු පුසුඹක් හැමුවේය. සුදු හූරාට ගෝන හම ගෙනවිත් දුන් රන්තුක එය පැදුරක් වගේ පොළවේ එළා පෙන්වීය. මේජර් ෆෝබිස්ට පුදුමය. මේ වනචාරි කොලුවා දන්න ආගන්තුක සත්කාරය. එවිට ඔහුට වහා සිහි වූයේ තේම්ස් නදියෙන් සිරිලක බලා එන්නට නැව් නැඟුන දය.

එද ඒ නැවේ පැමිණි ඉංග්‍රීසි සිවිල් සේවකයන් කී කතාය. නිල්ගල භූ පර්වතය යට භූ වංශයේ ගල්වැද්දන් ගැන තෝමස් ස්කිනර් කී කථාව ෆෝබිස්ට වහා සිහිවිය. යුද සේවය අමතකව මනරම් දූපත වටා වට රවුමක් රවුම් ගසා එන්නට සිතුන ෆෝබිස් මහනුවරින් හඟුරන්කෙතට පැමිණේ. එහිදී ඔහු දුටු අයස්කාන්ත කඳු වැටිය ෆෝබිස්ව රාජකීය හමුදුවෙන් සොබා දහමට යා කළේය. නමුණුකුලින් ඇසුන අනුරාපුර වරුණට ලොබ බැඳ මේජර් ෆෝබිස් අශ්වයා හරවා ගෙන මහවන මැදින් විත් දැන් මහතලා තැන්නේ වස්ගොමුව වන තැන්නේය. සුදු හූරා ගිනි පන්දමක් දල්වයි. තොල තබයි. උරයි. දුම් අරී. යළි උරයි. දුම් අරී. රන්තුක ඒ දුම්වලට ඉව අල්ලා බැලීය. විඳ නැති සුවඳක්. විඳ නැති රසයක්. සුදු හූරා දුම් වැටිය වැදි ගැටයාට පෑවේය. රන්තුක දෝතින් ගෙන තොලේ තබා හනික ඇද්දේය. රන්තුකට දැනුනේ පාවට්ටා පන්දම බිබී බඹර ගලේ පැණි කඩන දවසේ සතුට වගේ සතුටකි. රන්තුකගේ පැහැබර සිතුම් වැටහුණ ෆෝබිස් තවත් දුමක් දල්වා ගත්තේය.

දල්වා ගෙන ගෝන සම් ඇතිරිල්ලේ දිගා විය. දිගා වී සියඹලා රුකට හිස තබා ගති. අශ්වයා තැන තැන තණ කා විත් අසලින් ළඟ හිස දැහැන් තබා නෙත් පියාගෙනය. මේජර් ෆෝබිස් රන්තුකගේ දිලිහෙන ඇස් බලමින් තම මල්ලේ වූ සටහන් පොත අතට ගත්තේය.

ර..න්.. තු...ක....

රන්තුක හිස සොලවා සුදු හූරා ළඟට ළංවීය. සුදු හූරා නිහඬය. මොනවාද ලියනවා නේදැයි රන්තුකට සිතුණි. රන්තුක මේජර් ෆෝබිස් දෙසම බලා සිටී. ෆෝබිස් මොහොතකින් රන්තුකට පොත පෙන්වීය. රන්තුක හිනාවෙන් පුළුල් වී පුදුම වී සුදු හූරා දෙස බලා යළි සටහන් පොතේ ඉන්න තමන් දෙස බැලීය. වස්ගොමු විලේ නීල දියේ එබුනාම ජේන මමයි. රන්තුකට සිතුනි. රන්තුක සුදු හූරා ළඟටම ළංවී ඒ තමාමයි කීවේය. මේජර් ෆෝබිස් රන්තුකට ගෝන හම් ඇතිරිල්ලේ වාඩි වෙන්නැයි සන් කළේය. රන්තුක ෆෝබිස් ළඟින් වාඩි විය. මේජර් ෆෝබිස් ඒ පාර නිලුපුල්වලින් සාරසුබා නිලුපුල් විල චිත්‍රයට නැඟීය.

රන්තුක!
පෝබාස් හූරා!

උ..ඔ.. දන්නවද.... මකා නම!

මේජර් ෆෝබිස් තම සටහන් මත සිතුවම් කොට තිබූ කන්ද පෙන්නා ඇසුවේය. රන්තුක කන්ද බලා ඇස් කරකවා බැලීය. හිනා හුනේය. කිරි සුදු දසන් නඟා හිනාහුනේය. ෆෝබිස්ට ඒ කිරි සුදු දත් පෙළ ගෙනාවේ අපූරු හැඟීමකි. රන්තුක ඒ සමනල කන්ද බව කීවේය. එවිට ෆෝබිස් යළි සටහන් පොතේ මේ දැන් චිත්‍රයට නැඟි විල් සටහන පෙරලුවේය. එයට අත තබා විලේ නම රන්තුකගෙන් විමසයි. රන්තුක පොත බලා විල දෙස බැලීය. විල දෙස බලා ෆෝබිස් දෙස බැලීය. හිනා නැඟීය. බිම බලා ගති. කෙතරම් ඇහුවද රන්තුක විලේ නම නොකිව්වේය. හිනා නඟා ගුප්ත බැල්මෙන් බිම බලා පා සුළැඟිල්ලෙන් බිම හාරනු හැර රන්තුක කිසිත් නොකීවේය. ඇසූ වෙහෙස මිස ෆෝබිස්ට කිසිවක් අසාගන්න බැරි විය. ෆෝබිස්ගේ හිත එවිට ඉගිල ගියේ යළි තේම්ස් නදිය දිගේ විත් ඉන්දු සයුරට වැටුණු නැව් චාරිකාවටය. ඉංග්‍රීසි අධිරාජ්‍යයේ යටත්විජිත බලා ගමන් ගන්නා තම ජාතිකයන් ලංකාව ගැන කී කතාය. නැවේදී ඔහුට රොබට් නොක්ස් ගේ ලියවිලි හදරන්නට අවකාශය ලැබිණි. ඒ අවකාශය මේජර් ෆෝබිස්ගේ මානසික අවකාශය පුළුල් කළේය. සැබැවින්මය. ලංකාවේ වැද්ද උනත් අමුතුය. දැනුම හා අවබෝධය පුළුල් රන්තුක දෙස බැලූ ෆෝබිස්ට සිතුනි. ගුප්ත දයාවෙන් තමා දෙස බලමින් තවමත් බිම හාරන රන්තුක පා සුළැඟිල්ල දුටු ෆෝබිස්ට සිතුනේය.

හෙළ දෙරණ

ඉතිහාසයේ පිටු අතරින් සැඟවුණු අපූරු සිදුවීම් පෙළක්

ලංකාවේ ඉංග්‍රීසි අධිරාජ්‍ය යුද උපදේශකවරයා ලෙස පත්වීම් ලැබී මේජර් එච්. ෆෝබිස් මෙහි සැපත් වූවේය. එනමුත් ඔහුගේ සිත සමනල කන්ද හඟුරන්කෙත කඳු අස්සෙන් දුටු ද හැරවුමකට හැරුනේය. අධිරාජ්‍යයේ මෙන්ම රොබට් විල්මට් හෝර්ටන් ආණ්ඩුකාරයාගෙන් වසන් වී ඔහු ලක වටේ වට රවුම් ගසමින් හත් මසක්ම ඇවිදිමින්ය. රන්තුක සහ ෆෝබිස් දෙදෙනාටම දෙදෙනා නැතිව ඉඳින්නට බැරි තරම් ආත්මීය බැඳීමක් ගෙතුනේය. වස්ගොමු තැන්නේ දෙදෙනා බොහෝ දුර ඇවිද ගියේය. ආදි හෙළේ විස්ම ප්‍රකාර නටබුන් අතර ඇවිද ගියේය. දවසක මිහින්තලේ සිටි මහ වලස් පොරයකට මැදිවූ ෆෝබිස්ව රන්තුක බේරා ගත්තේය. වලසුන්ගේ නියෙන් ඉරී දෙපළු මස් වැදිලි ගස් කොළ කොටා සුව කර ගත් පුදුමය ෆෝබිස් අවදි කළේය. මිහින්තලා ගල පිය ගැට පෙළ දඹුලු ලෙන් පළමුව දුටු නූතන මිනිසා බවට ෆෝබිස් පත් වූයේ එලෙසය.

මිහින්තලා වැවෙන් ගොඩවී රන්තුක හබරණ මහ වනාන්තරයට වැටුණේ හාර මාසයකට පසුවය. රන්තුකට රුහේ අමතක වූවේය. ෆෝබිස්ට අධිරාජ්‍ය සේවය අමතකය. පත් ඉරුවෙන් ඉරුවෙන් මේ මනස්කාන්ත රටේ මහ විල් වන රාජයන් අතර සැඟවුණ විශ්මාන්විත අතීත ස්මාරක ෆෝබිස් නෙත ගැටේ. එකින් එක ගැන ලියමින් චිත්‍රයට නඟමින් පා නගයි. නවතී. ගිමන් හරී. අල කොළ පලා පළ දඩයම් එකට ගෙන රන්තුක වන ඵලයන්හි රස අග්‍රහාරයෙන් ෆෝබිස් නලවයි. වංශ කථා රුහේ කතා කුලේ කතා කන්දේ කතා අතරින් දවසක ඔහුට "උපුල් කන්ද'' යැයි කියැවුණේය.

උපුල් කන්ද!
ෆෝබිස් හූරා අමුතුවට තොල් පෙරළා ඇස් විශ්මානයෙන් ලොකු කරමින් ඇසුවේය. රන්තුක අසරණ වූයේය. අහස එකොළොස් මසක්ම පුරහඳ පෙන්වූ බව රන්තුකට මතකය. මේජර් ෆෝබිස් සහ රන්තුකගේ බැඳීමට වසරකුත් ගෙවෙන්නට ආසන්නය. රුහේ රහස කට තොලින් පැන ගත්තායි බියක් රන්තුකට වහා ඇතිවිය. බිය පත් නෙත් ෆෝබිස්ගේ බැඳීම් සහගත බැඳීමට දිස් විය. ෆෝබිස් විත් රන්තුකගෙන් උපුල් කන්ද (උපුල් වෙහෙර) ගැන විමතිව විමසීය. රන්තුකට නිහඬව සිටින්නට බැරි තරම්ය. රෑ තාරකා වසමින් සඳ එළිය මෝදු වන්නේය. යළි බිනර මහ උදා වෙමින්... රන්තුකට ෆෝබිස් හූරා හමු වූයේ බිනර මල් පිපුණු බිනර මහේදී බව සිහිවිය. ෆෝබිස් විත් රන්තුකගෙන් යළි ඇසුවේය. උපුල් කන්ද ගැන දිග කතාවක් කියන්නට රන්තුකට සිදු විය.

රන්තුක දිග කතාවම කීවේය. මැදියම් යාමේ මේජර් ෆෝබිස්ට හිනා ගියේය. හොඳටම හිනා ගියේය. සුරංගනා කතාවක් තරම් සුරංගනාය. දෙව් ලියන් ගොඩබැසපු ගිරි කූඨයක් රත්තරන් පහන් දල්වා චිත්‍ර ඇඳළා කවි ලියලා. ඒකට යන්න තියෙන්නේ සිංහයෙකුගේ කට ඇතුළින්. ඒක හදපු රජ්ජුරුවන්ගේ දුව උපුලි උපුල කන්දෙ භූ ගර්භයේ තාම ජීවත් වෙනවා. ෆෝබිස්ට මේ කතාව අදහා ගනු බැරි තරම් සුරංගනාය. මනෝ මායාමය.

රන්තුකගේ කථාව අවසානයේ හිනා නැඟූ පෝබාස් හූරා විමතිය විහිළුව සමඟ තවමත් හිනාවෙන්ය. අශ්වයා ඇහැරී වට පිට බැලුවේය. තමා විශ්වාස නැති පෝබාස් හූරා ගැන රන්තුකට දුකය. රන්තුකගේ මුහුණ පුරා දුක් රේඛා ඇඳී යද්දි ෆෝබිස් ගිනි මැලයට ළංව වල් ඌරාගේ මස් පෙති ගිනි මැලයට ළං කළේය.

ආ... අර.....

රන්තුක කෑ ගසා කී දෙස මේජර් ෆෝබිස් බැලුවේය. තරු වැලක් මින් රැලක් වගේ පායපු අහසක්. එද අමුතු අහසක් දිස් වූයේ යැයි ෆෝබිස්ට සිතුනි. ෆෝබිස් හූරා රන්තුකට ළංවී ඒ මන්දැයි විමසීය. රන්තුක කීවේ හැම බිනර මහටම මින් රැළ තරු වැලක් වගේ පායන්නේ ගිරි කූඨය උඩින් බවය. ගිරි කූඨයට යන පාර උඹ දන්නවාදැයි මේජර් ෆෝබිස් රන්තුකගෙන් ඇසුවේය. රන්තුක ෆෝබිස් දෙස බලා ඔව් යැයි කීවේය.

රන්තුකගේ සෘජු රිද්මයට මේජර් ෆෝබිස් වහා නැඟිට්ටේය. රන්තුක සමඟ ඒ ඓතිහාසික රහස සොයා පිය නැඟීය.

දෙළොස් දිනක වෙහෙසකර ගමනකින් රූස්ස වන රේබාවකින් වසා ගත් කඳු පව්වක් පාමුලට ෆෝබිස් විත් තිබුණි. රන්තුක පා පොළවේ නැමී නැමී සතර අතට නළල බිම තබා වඳින දෙස මේජර් ෆෝබිස් බලා සිටියේය. එක විටම වනයෙන් කඩා පැන ගත් දිවි පොව්වෙකු රන්තුකගේ බෙල්ලට පැන බෙල්ල කඩා පැන දිව්වේය. ෆෝබිස් දුක් සාගරයේ ගිලිමින් එතැනම රන්තුකගේ මිනිය බද වැළපුණේය. මේ පෞර්ෂවත් යුද සේනාධිපති රදළයා මහ දුකින් හැඬුවේය. තමන්ගේ ආගමේ චාරිත්‍රය අනුව රන්තුක වළලා දඬු දෙකකින් කුරුසයක් තබා ගෞරව කළේය. එතැනම වැටී කැළෑ කොළ කකා රන්තුක ගැනම සිහි කර කර මේජර් ෆෝබිස් මදුරුවන් තලමින් ඔහේ බලා සිටියේය.

දිනෙන් දින ගෙවී යද්දි ඔහුගේ මනස පුරා දෝංකාර දී රන්තුකගේ කටහඬ මතුවේ. රන්තුක කී ගිරිකුළු රාජධානිය ඒ මනෝමය මනෝ මායාව මෙනෙහි වේ. සෑම රාත්‍රියේ ඔහු අහස බැලුවේය. එක දවස ඔහු දුටුවේය. ඒ උපුල කන්ද මුලදී රන්තුක පෙන්වූ අමුතු තරු එළියය. ඔව් ඒ තරු වැළක් මින් පෙළ වගේ සිටින තරු රටාවය. රන්තුක කීවේ මින් රැළක් තරු වැළක් වෙලා ඉන්න බවය. ෆෝබිස් නැඟී සිටියේය, සතර අත බැලුවේය. යළි අහස බැලුවේය. ඔහුට රන්තුකගේ අවසන් මොහොත සිහිවිය. සතර අතට වැඳ වැටුණු රන්තුක බිම දිගා වී නළල තැබුවේය. මේජර් ෆෝබිස් වහා රන්තුක නළල් තලය තබා වැඳ වැටුණු තැනට දිව ගියේය.

රන්තුක තම නළල තැබූ තැන තුවක්කු බඳ ගසා හෑරුවේය. දඬු උලක් සාද හාරා පස ඉවත් කළේය. ඔහු පුදුමයෙන් පුදුමයට පත් විය. පුදුමයෙන් විමතියට පත් විය. විමතියෙන් විශ්මයට පත් විය. විශ්මයෙන් කුතූහලයට පත් විය. ඔහු දුටුවේ ශෛල මහපට ඇඟිල්ලකි. එනම් සීගිරි සිංහ පාදයේ මහපටැඟිල්ලය. ඒ සීගිරිය සොයා ගත් මොහොතය. සියවස් හතරක් ලංකා පොළවේ මිනිසුන් පවා නොදැන සිටි සීගිරියට ගිය පළමු නූතන මිනිසාය. සීගිරිය ලොවට යළි විවර වූයේ එදය. මේජර් ෆෝබිස් දුටු දුටු දේ ලීවේය. හැකි හැකි තරම් දුටු දේ චිත්‍රයට නැඟුවේය. එක විටම කැලේ යක්කු ගසා මේජර් ෆෝබිස් ඔත්පොල විය. අධිරාජ්‍ය හමුදව සොයා පීරා සොයන සුදු හූරා හබරණ ගම් වැද්දන් සොයා ගන්නා ලදී. සොයාගෙන ලී මැස්සක නංවා දඹුල්ලට ගෙනාවේය. ඔහු වහා ප්‍රතිකාර සඳහා මහනුවරට යොමු කළේය. එතැනින් නිසි සේ සුවපත් නොවූ මේජර් ෆෝබිස් වහා එංගලන්තයට පිටත්කර හැරියේය. එහි සිට ඔහු Eleven Years in Ceylon කෘතිය ලියමින් සීගිරියට ලොව යා කළේය. රන්තුක හා ෆෝබිස්ගේ බැඳීම ඉතිහාස රහස් දෙර හරින සැබෑ කථාවය. ෆෝබිස්ගේ දින පොතින් ගෙන එය ලියමින් සිටියදී කැලෑ උණෙන් මිය ගියේය. ඒ රන්තුක සඳ රහසක් වෙමිනි.

සුජිත් අක්කරවත්ත

කැමරාවට හසුවූ හඳුනා නොගත් යානා පෙළක්

ත්‍රාසජනක සංදර්ශනයෙන් ගුවන් නියමුවා මවිතයට



පෙන්ටගනයේ විද්‍යාඥයන්ට අනුව කෝපයට පත් ගුවන් හමුදා නියමුවෙකු හඳුනා නොගත් යානා පෙළ හා මුහුණට මුහුණ ගැටීම විශ්වයෙන් එහා ලෝකය හා සම්බන්ධ නවතම තොරතුරයි.

ආසන්නතම තොරතුර වන්නේ මෙම පෙරළිය සිදු වූ චීනයේ දකුණු මුහුදු සීමාවට ඉහළ අහසේ නොවැම්බර් 4 වන දින මතුවුනු අත්භූත එළි නවයකින් බැසයන වළාකුළුවල රටා ඇඳ ඇසිල්ලකින් සැඟව යන අයුරු දැක්වෙන ත්‍රාසජනක වීඩියෝ පටයයි. "මම දන්නේ නෑ ඒ මොකක්ද කියලා" හඳුනා නොගත් යානා පිළිබඳ සොයමින් අන්තර්ජාලයේ සැරිසරන්නන්ගේ නොමඳ තිගැස්මට හේතු සපයමින් විනාඩි 53ක් දිවෙන, අනන්‍යතාව තහවුරු නොවූ වර්ණ වීඩියෝ පටයක් තුළින් වික්ෂිප්ත වූ නියමුවාගේ හඬ ඇසේ. "ඒක මහ අමුතු *** - ඒක පියාඹනවා"

හමුදාව විසින් අනන්‍යතාව හෙළි නොකරන නිර්භීත ගුවන් නියමුවා එම අමුතු පියාසර වස්තුව ඇස ගැටුණු මුළු කාලයේම චීනයේ හොංකොංවලට අඩි 39,000ක් ඉහළ අහසේ පියාසර කරමින් ඉද ඇත. පසුව ඔහු එම ඡායාරූප හඳුනා නොගත් යානා ලුහුබඳින වෙබ් අඩවියකට මුදහැර තිබුණි.

එසේ තිබියදීත් 2004 සිට ලැබුණු හඳුනා නොගත් යානා දර්ශන 144ක් හා සම්බන්ධ සිද්ධීන් සහ පිටසක්වල යානාවක් සෙවීම පිළිබඳව වූ ඡායාරූපගත සාක්ෂි ගැන කිසිදු විස්තරයක් නොකර පෙන්ටගනය මෑතක දී සංශෝධිත වාර්තාවක් ඉදිරිපත් කොට තිබුණි.

සැප්තැම්බරයේ දී, ආරක්ෂක ගිවිසුම්කරු ලොක්හීඩ් මාටින්ගේ අතිශ්‍ය රහසිගත හෙලන්ඩාල් රේඩාර් පද්ධතියට කැලිෆෝනියාවේ දී තද අලු පැහැති පියාඹන පීරිසියක හැඩයේ යානයක් හසු වී අනතුරු ඇඟවීමේ සංඥ නාද වූ වීඩියෝවක්ද නිකුත්ව තිබිණි.

ඇතැම් විචාරකයන්ගේ අදහස වනුයේ හඳුනා නොගත් යානා යනු පිටසක්වල යානාවලට එහා ගිය යම් පෙර නිමිත්තක් විය හැකි බවත් එය යම් විදේශ හස්තයක් මගින් තම දියුණු ආයුධ තාක්ෂණය පරීක්ෂා කිරීමක් වෙන්නටත් හැකි බවත්ය.

එක් දර්ශනයක් පිළිබඳ අදහස් විමසූ විට, නාසා හි පරිපාලක බිල් නෙල්සන් පැවසුවේ :"එයාලා (නියමුවෝ) දන්නවා එයාලා දැක්ක දේ. එයාලා ඒක යන පාර හොයාගෙන, ඒකට රේඩාර් යවලා, ඒක ලුහුබැඳලා. ඒක එක තැනක ඉඳන් තව තැනකට වේගෙන් චලනය වෙලා. මට හිතෙන හැටියට එතන පැහැදිලි යමක් තියනවා. ඒක මොකුත් පිටසක්වල දෙයක් නොවෙන්නත් පුලුවන්. ඒත් ඒක අපේ හතුරොන්ට අදළ මොකක් හරි තාක්ෂණික දෙයක් නම් අපිට කල්පනාවෙන් ඉන්න වෙනවා".

නව හඳුනා නොගත් යානා සොයාගැනීම් පිළිබඳ අධ්‍යයනයට නොවැම්බර් මාසයේදී පෙන්ටගනය "පියාසර වස්තූන් හඳුනාගැනීම සහ සමමුහුකරණ කළමනාකරණ කණ්ඩායම" AOIMSG නමින් ස්ථිර කාර්යාලයක් පිහිටෙව්වා.

"–UFOs and the White House : What Did Our Presidents Know and When Did They Know It"" හි සම කර්තෘ විලියම් බයනස් විශ්වාස කරනුයේ පෙන්ටගනය යම් විශාල හෙළිදරව්වකට කුරුමානම් අල්ලන බවයි.

"මුලින්ම පොළවට පතිත වුණු පියාසර යානය 1947 දී නව මෙක්සිකොවේ රෝස්වෙල් හි ඒරියා 51ට ගෙනගිය අවස්ථාවේ ඉඳන්ම අපි හෙමි හෙමින් යම් හෙළිදරව්වකට අවතීර්ණ වෙමින් හිටියා" ඔහු පැවසීය. "රජය දශක කීපයක සිට විශ්වයට එහා අය සමඟින් පූර්ණ තොරතුරු හුවමාරුවක හිටියා" ඔවුන් හෙමින් කොටස් වශයෙන් තොරතුරු හෙළි කිරීමට උත්සුක වනුයේ මිනිසුන්ට යම් ක්ෂණික කම්පනයකට යටත් නොවී සියල්ල ග්‍රහණය කරගැනීමට හැකිවන ලෙසයි'' ඔහු පැවසීය.

නැෂනල් ඉන්ක්වයරර් සඟරාව අනුග්‍රහයෙනි.

පරිවර්තනය : ගීත්මී තොටහේවා

ලංකාදීප
රසවින
2022 මාර්තු 13 වැනිදා ඉරිදා



ඒකනායක හූරා සහ කිරිනැනී

ආදිවාසීන්ගේ ජනවහරේ කිසියම් කාන්තාවක කිරිනැනී නමින් හඳුන්වන්නේ නම් ඒ ඇයට කරනු ලබන ඉහළම ගෞරවයය. ආදිවාසී සනුහරේ නායකයාගේ භාර්යාව හැරුණු විට ඉන් පරිබාහිරව සිංහල ජනසමාජයේ කාන්තාවක කිරිනැනී යන නමින් හඳුන්වන්නේ නම් එය ඉතා විරල තත්ත්වයකි. දඹාන ආදිවාසීන් විසින් එසේ කිරිනැනී යන ගෞරව නාමයෙන් හඳුන්වන ලද කාන්තාවක මින් වසර තුනකට පමණ ඉහතදී අහඹුවෙන් මෙන් මට මුණගැසිණි. (කිරිනැනී යන්නෙන් මහේසිකාව, රැජින යන අරුත් දනවන බව කියැවේ.) ඕ සුධර්මා කුමාරි ඇතිපොළ නම් වූවාය.

වර්ෂ 1927 ඔක්තෝබර් මස 10 වැනි දින මාතලේ දිසාවේ ගලේවෙල කොළඹුගොල්ල වලව්වේදී උපත ලද ඇය ප්‍රථමයෙන් ගලේවෙල මිශ්‍ර පාඨශාලාවෙනුත් අනතුරුව පාක්‍යම් බාලිකා විද්‍යාලෙනුත් අධ්‍යාපනය ලැබුවාය.

සුධර්මා කුමාරි ඇතිපොළ කිරිනැනී බවට පත්වීමේ කතාව ද අපූරුය. වර්ෂ 1952 දෙසැම්බර් 25 දින යුගදිවියට ඇතුළු වන සුධර්මා කුමාරි ඉන් දවස් දහසයකට පසුව දඹානේ පදිංචියට යන්නීය. ඒ ඇය එවකට දඹාන ආදිවාසීන්ගේ ගුණසාධක නිලධාරියා වන විජේරත්න බණ්ඩාර ඒකනායක සමඟ විවාහ වීමත් සමගය.

සරුසාරවත් පවුලක සැපවත් දිවියක් ගතකළ එවකට විසිපස් වැනි වියේ පසුවූ තරුණියක වූ ඕ අදින් වසර 68 කට පමණ ඉහතදී අතිශය දුෂ්කර අලි කොටි වගවලසුන්ගෙන් පමණක් නොව විෂකුරු සර්පයින්ගෙන් ද ගහණ මහ ගණ වනාන්තරයක පිහිටි දඹාන වැනි ගමක පදිංචියට යෑම පුදුම එලවන සුළුය.

එය එසේ වන්නේ අද වන විට ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් ජල විදුලිය සමග නිවාස පහසුකම් ද තිබෙන දඹානේ සේවයට යන්නට පිරිමින් පවා අදිමදි කරන පසුබිමකය.

ඉදින් සුධර්මා කුමාරි දඹානේ සේවය කළ සිය සැමියා වූ විජේරත්න බණ්ඩාර ඒකනායක සමග එදවස ගතකළේ කැලෑවේ අටවාගත් කුඩාරමක් තුළය. විජේරත්න බණ්ඩාර ඒකනායක වූ කලී 1946 සිට 1953 වසර දක්වා එකදිගට වසර හතක් දඹානේ නේවාසිකව ආදිවාසී ජනයාට සේවය කළ පළමුවැනි රාජ්‍ය සේවකයාය.

සමාජ සේවයට දැක්වූ ඇල්මත් විවාහයෙන් පසුව කුමන තත්ත්වයක් යටතේ වුවද සිය ස්වාමීයා සමඟ එකට ඔහුගේ සෙවනැල්ල සේ දිවි ගෙවිය යුතු යැයි ඇගේ වැඩිහිටියන් ඇයට ලබා දී තිබූ ඔවදනත් නිසා තමන් ඉතා කැමැත්තෙන් දඹානේ පදිංචියට ගිය බව සුධර්මා කුමාරි පවසන්නීය. දඹාන ගම්මානයේ සිට එහි දිවි ගෙවූ වසරකට ආසන්න කාලය පමණක් නොව දඹානට ගිය මුල්ම ගමන ද ත්‍රාසයෙන් පිරි අත්දැකීම් ලබනට සිදුවූවක්. ඇය ඒවා සිහිපත් කළේ සතුටින් හා සිනහමුසු මුහුණෙන් යුතුවය.

දිනය හරියටම පවසන්නේ නම් 1953 ජනවාරි 10 වැනි දාය. විජේරත්න බණ්ඩාර ඒකනායක සහ සුධර්මා කුමාරි ඇතිපොළ කොළඹ බදුල්ල රාත්‍රී දුම්රියෙන් මහනුවර සිට බදුල්ලට ගියහ. ඔවුන් බදුල්ලට ගියේ විජේරත්න බණ්ඩාර ඒකනායකගේ ප්‍රධාන කාර්යාලය වූ බදුල්ල කච්චේරියට ගොස් රාජකාරි කටයුතු කීපයක් ද සිදුකරගත යුතු බැවිනි.

බදුල්ල දිසාපතිවරයා මුණගැසී රාජකාරි කටයුතු අවසන් කරගත් පසුව නව යුවලට දඹානට යෑම සඳහා දිසාපතිවරයා විසින් ලෑන්ඩ්රෝවර් වර්ගයේ ජීප් රථයක් ලබාදෙන ලද්දේ ඒ ගමන දුෂ්කර වූවක් බැවින්ය. බදුල්ල කච්චේරියේ රාජකාරි නිමා කළ ඒකනායක මහතා දිවා ආහාරය සඳහා බත් පාර්සල් තුනක් ද රැගෙන බදුල්ලෙන් පිටත් වූයේ අතරමගදී දිවා ආහාරය ගනු රිසියෙනි.

කාලගුණය හොඳින් පැවතියද බදුල්ල මඩකළපුව මාර්ගය පැවතියේ අබලන් තත්ත්වයෙන් බැවින් ජීප් රථයකට වුවත් කඩිනමින් ධාවනය කළ හැකි නොවූයේය. ඒ අතරේ මාර්ගයේ පැවැති කඳු පල්ලම් වංගු මෙන්ම සපත්තු පාලම් ද වූයෙන් රියදුරුට රථය ධාවනය කිරීම තවත් දුෂ්කර වූයේය. කෙසේ හෝ සවස හතර පමණ වෙත්දී පදියතලාවට යා හැකි විය. එතැන් සිට මඟියංගණය දෙසට පැමිණ දඹාන හන්දියෙන් හැරී දඹාන ගම්මානයට යා යුතු විය. ඒ දුර මයිල දාහතරකි.

දැන් ජීප් රථය ඒ මගේ දිවෙයි. මාවත දුෂ්කර වූවකි. වළගොඩැලි සහිතය. රියදුරු ඒවා මතින් ජීප් රථය ධාවනය කරවයි.

පදියතලාවේ සිට මයිල හත අටක් ගිය තැන මාදුරුඔය මුණගැසේ. මේ හරහා සපත්තු පාලමක්වත් ඉදිකර නැති බැවින් ඔය තරණය කළ යුත්තේ පරිස්සමෙනි. කලින් අවස්ථාවලදී ජීප් රථය පහසුවෙන් මාදුරුඔය තරණය කළත් එදින ඔවුනට බාධාවක් ඇතිව තිබිණ. ඒ මාදුරුඔයේ ජල මට්ටම වැඩිව තිබුණ බැවින්ය.

ජීප් රථය නවතා ඉන් බැසගත් ඒකනායක රියදුරු කෝකිලන්ට කීවේ අද නම් ඔයේ වතුර වැඩියි යනුවෙනි.

එසේ පවසා ඇඳ සිටි කලිසමේ කකුල් දෙදණ තෙක් නවාගෙන මාදුරුඔයට බැස්ස ඔහුට පෙණුනේ වතුර මට්ටම දණටත් ඉහළින් පවතින බවය.

'උඩහට වැහලා' කෝකිලන් අපි ටිකක් වෙලා ඉඳල යමු. ටිකකින් වතුර අඩුවෙයි. ඔහු රියැදුරුට කීවේය. වතුර අඩුවෙන කොට වැල්ල පෑදෙනවා ඒකනායක නැවතත් කීවේය.

'සර් බයවෙන්න එපා මීට වැඩිය අමාරු තැන්වලින් මම ජීප් එක අරන් තියනවා. සර් නගින්නකෝ' කෝකිලන් පැවසීය.

කලක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රියදුරකු ලෙස සේවය කර ඇති වැඩි කලබලකාරයෙකු ද නොවූ කෝකිලන්ගේ කීම විශ්වාස කළ ඒකනායක ජීප් රථයට ගොඩ වූයේය.

රියදුරු මාදුරුඔයට ජීප් රථය ධාවනය කර පොඩ්දුරක් පමණක් ගෙන ගිය මුත් ඉන් එහාට හෝ පසුපසට ධාවනය කරන්නට අසමත් වූයේය. ජීප් රථය අඟලක්වත් එහාට මෙහාට කරගත නුහුණු තැන පැවසුවේ සර් නෝනට ස්ටියරින් එක අල්ලගන්න කියල අපි දෙන්නා ජීප් එක තල්ලු කරමු යන්නය.

ජීප් රථයේ එන්ජිම නවතා ඉන් එළියට බැසගත් ඒකනායක හා කෝකිලන් ජීප්රථය තල්ලු කළෝය. සුක්කානම අල්ලාගත් සුධර්මා ජීප් රථය තුළ සිටින්නීය. එහෙත් ඔවුනගේ උත්සාහය නිෂ්ඵල විය.

'ඔය වෙලාවෙ ජීප් රථය ඇතුළටත් වතුර ආවා' සුධර්මා කියන්නීය.

ඊට පස්සේ මහත්තයා ඔයෙන් එගොඩවෙලා ගහක් උඩට නැගලා මහ හයියෙන් හූ කීවා. ටික වේලාවකින් වේවත්තේ පන්සලේ හාමුදුරුවේ වැදි මිනිස්සු කට්ටියකුත් එක්ක ආවා. පස්සේ ඒ අයත් ජීප් එක තල්ලු කළත් එගොඩකරගන්න නොහැකි වුණා. ඊළඟට කට්ටියක් ගිහින් කඹයක් අරන් ඇවිත් ඒක බම්පර් එකේ බැඳල ඇද්දා. තව කට්ටියක් තල්ලු කළා. එහෙම කරල තමයි ජීප් එක ගොඩට ගත්තේ. එතකල් මම ජීප් එක ඇතුළෙ තමා හිටියේ. සුධර්මා කියන්නීය. මා සුධර්මාගෙන් මේ කතාව අසන විට ඇය සිටියේ අනුපස්වැනි විය ගතකරමිනි.

දන්නවද ජීප් එක ගොඩට ගත්තා විතරයි එකපාරටම මාදුරුඔයේ වතුර දෙගොඩතලාගෙන ගියා. ඇය එවර පැවසුවේ සිනාහමුසුවය.

ඉතින් ජීප් එක ඇතුළට වතුර දානකොට ඔබට බය හිතුණේ නැද්ද? මම ඇයගෙන් ඇසීමි.

ඇත්තටම මට එහෙම බයක් නම් දැනුණේ නෑ. ඇගේ මුහුණේ සැහැල්ලු සිනාවක් පහළ විය.

ගැමි රසවිත

කොහොම හරි එතන ඉඳල නැවතත් අපි ජීප් එකෙන්ම වේවත්ත පන්සලට ගියා. හාමුදුරුවෝ තේපැන් සංග්‍රහයක් එහෙම ලෑස්ති කරල තිබ්බා. ඒකත් භුක්ති විඳල ආයේ දඹානට ගියා.

වැදි මිනිස්සු අපිව පිළිගන්න තොරණකුත් ගහල තිබුණා. සිංහල අයත් ඒකට උදව් කරල තිබුණා. අනේ ඒක අභිංසක තොරණක්. තොරණ පාටකරලා තිබුණෙ රෙදිවලට දමන නිල්කුඩුවලින්.

ඇය තොරණ ගැන පැවසුවේ එලෙසිනි.

දඹානේ ඒකනායකගේ කුඩාරම අසලදී ආදිවාසී ජනතාව ඉමහත් හරසරින් ඒකනායක යුවළ පිළිගත් අතර එතනදී ඔවුන් සුධර්මාව හඳුන්වනු ලැබුයේ 'කිරිනැනී' ලෙසිනි. එදවස සිට ඔවුන්ට සුධර්මාව කිරිනැනී වූ අතර ඒකනායක පෙර සේම ඒකනායක හූරා වූයේය. විවාහ වී දින 16 කින් මහ වන මැද කුඩාරාමකට කොටුවුණ නව යුවළක දිවිය කෙබඳු විය හැකිද? විශේෂයෙන්ම වත්පොහොසත්කමින් යුතු සරුසාර පවුලක විසිපස් හැවිරිදි යෞවනියක මහ කැලෑවක ගතකළ දිවිය කෙබඳු විය හැකිද?

කැලෑව මැද ඔයෙහි ඔවුනු ඇති පදම් සතුටු වූහ. කෙලිකවටකම් කළහ. දෙදෙනාට දිය ඉසගත්හ. හෝරාවක් හමාරක් කාලය ගෙවෙනු ඔවුන් දෙදෙනාටම නොදැනුනි. එක්වරම ඔයෙහි එගොඩ ඉවුර දෙස නෙත් යොමුකළ ඒකනායක දුටුවේ තමන් අසලටම වාගේ පැමිණ සිටින අලි රංචුවකි. අලියැයි පවසමින්ම සුධර්මාගේ අතින් ඇදගෙන ඒකනායක හූරා ඔයේ ඉවුරට ගොඩවී ඇයගේ අතින් අල්ලාගෙනම දුවන්නට විය. එක්වර ඔහුගේ අත ගසා දැමූ සුධර්මා වහා දිවගොස් ඔවුන් දෙදෙනාගේ ඇඳුම් ටික පොදියක් සේ ගුලිකර ගෙන සිය කිනිල්ලේ හිරකරගෙන ආපසු දුවගෙන ආවාය. මේ බිහිසුණු මොහොතේ ඇය කළ ක්‍රියාවට ඒකනායක හූරාට කේන්ති ගිය මුත් අලි සිටි නිසාවෙන් මුවෙන් නොබැනම ඉදිරියට දුවගොස් අසල තිබූ කුඹුක්ගසකට ඇය නංවා තමාද එහි නැග ගත්තේය. ගසට නගින අවස්ථාවේත් ඇය රෙදිපොදිය මහත් වැරෙන් තුරුලු කරගත්තාය. එසේ ගස උඩ සිට අලි ගිය පසු බිමට බැස දිය රෙදි පිටින්ම කුඩාරම වෙතට ආ සැණින්ම ඒකනායක හූරා සුධර්මා අමතා කේන්තියෙන් පැවසුවේ,

'ඔයා නම් පුදුම ළමයෙක්. ඇයි මනුස්සයෝ අලි ගහයි කියන මරණ බියක් කියෙද්දි රෙදි කඩමාළු ටිකක් පස්සේ දුවගෙන ගියේ. අලි මෙගොඩට එහෙම ආව නම් ජීවිතෙත් ඉවරයි නේද?' යනුවෙනි.

එය ඇසූ සුධර්මා මදහසක් නැගුවා පමණි. ඔයාට නම් හිතා කොහෙද ගැණුන්ට රෙදිවළිනුයි කීවොත් ඉතින් එයිට වඩා දෙයක් නැනේ.' ජීවිතෙත් එයිට වඩා වටිනවද?

'ඔව් අපි දෙන්නගේ ජීවිත ගැන හිතල තමා මම රෙදි ටික අරන් ආවේ' එවර සුධර්මා කීවාය.

ඒ කොහොමද?

බැරිවෙලාවත් අලි මෙගොඩට ආව නම් අපේ රෙදිවල කුවිල උන්ට දැනෙනවා. එහෙම උනානම් උන් අපි පස්සේ එලෝනවනේ.

ඔයා කොහොමද අලින්ට මිනිස්සුන්ගෙ ඇඳුම්වල කුවිල දැනෙනව කියල දන්නේ?

ඇයි ඔයා දන්නේ නැද්ද අපේ ගෙදර අලි තුන්දෙනෙක් ඉන්න විත්තිය. එවර සුධර්මා කීවාය.

සුධර්මා දඹානට ගොස් දින 25 ක් ගතවුණු දවස ශ්‍රී ලංකාවේ පස්වැනි නිදහස් දිනය උදා විය. දඹානේ ඇත්තෝද මේ නිදහස් උත්සවය සැමරුවෝය. ආරාධිතයින් වූයේ වේවත්තේ පන්සලේ හාමුරුවන්, බුබුලේබණ්ඩා ගමරාල, වැදි සනුහරේ නායක ඌරවරිගේ තිසාහාමි හා ඒකනායක හූරාය. මේ උත්සවයට සුධර්මාද සහභාගි වූයේ ඉතා සතුටිනි.

උත්සවයේ කතාබහා අතරේ දේශනයක් කරන්නට වැදිනායක තිසාහාමිගෙන් සුධර්මාට ආරාධනාවකි. පාසලේදී කථික තරගවලට සහභාගි වූ සුධර්මාට කතාවක් නැවැත්වීම සුළු දෙයක් වුවත් නිදහස අරභයා කතා පැවැත්වුන බැවින් ඒ ගැන කතා නොකර වෙනත් කතාවක් කරන්නට ඉටා ගත්තාය.

ඇගේ ඉලක්කය වූයේ වැදි කාන්තාවන්ය. ඇය ඔවුන්ට සෞඛ්‍ය පුරුදු සහ අරපරෙස්සම ගැන කතාවක් කළාය. භාෂා පරිවර්තනය කළේ තිසාහාමිය.

ඇය අරපරෙස්සම ගැන කියමින් නිවෙසක කාන්තාව දිනපතා ආහාර පිසින්නට සහල් ගනිද්දී ඉන් කිසියම් ප්‍රමාණයක් ඉතිරි කළ යුතු බව කීවාය. මෙය සාම්ප්‍රදායික ගෘහණිය ඉතිරිකරන මිටිහාල් නොවේ. ගෘහණියක මිටි හාල් එකතු කරන්නේ දනට පිනට දීමටය. එහෙත් මේ එකතු කරන්නේ හදිසියේ ගෙදරක සහල් හිඟ වී ගියහොත් ප්‍රයෝජනයට ගැනීමටය.

මේ කතාවට තිසාහාමිගේ හිත ගියේය. ඔහු පරිවර්තනයක් සමග ඔහුගේ උපදේශයක්ද එකතු කළේය.

'බලපල්ල උඹල ගෙදරකට හාල් ගෙනාපුවහම ඒක දවසින් දෙකෙන් ඉවර කරනව. මේ කිරිනැනී කියන කතාව අහපල්ලා උඹලට හොඳ උපදේශයක් තමයි ඇය කීවේ.' යනුවෙන් ඔහු කීවේය.

එතැන් පටන් වැදි ගැහැණු කිරිනැනීගේ ඇසුර පැතූහ. විශේෂයෙන්ම තිසාහාමිගේ බිරිඳ ඇයගේ කුළුපගුම මිතුරිය බවට පත් කරගත්තේ කිරිනැනීය.

ඒකනායකලාගේ කුඩාරමට දිනපතා ජලය රැගෙන වුත් දුන්නේ වැදි කොළුවෙකි. එසේ ගෙනා ජලය ඈ උණුකර පානීය ජලය සකසා ගත්තාය. එක්දිනක් ඇය කොළුවාට කීවේ වතුර ගෙනෙන තැනට තමන් ද කැඳවාගෙන යන ලෙසටය. එක්ක යන්න නම් පුළුවන් ඒත් කිරිනැනී' කොළුවා තැනනුවේය.

ඇයි ඒත් කීවේ.

නෑ කිරිනැනී එතනට ගියොත් ආයෙ වතුර බොන එකක් නෑ. කමක් නෑ එක්ක පලයන්කෝ. ඒ අනුව කොළුවා සුධර්මාද කැටුව දිය ගෙන එන්නට ගියේය.

දියගන්නේ කුඩා වැවක් බඳු තැනකිනි. පසෙක හරකුත් ලැග සිටි අතර ඔවුනේ ගොමද වතුර වළේ තිබුණේය.

ඇයට වහා සිය මව සිහි විය. බොන වතුරත් වැදූ මවත් ගැන කවදවත් කැත හිතන්න එපා. ඒ අය පැවසූ වදන්ය. ටික කාලෙකදී අපිට ආණ්ඩුවෙන් වතුර ෆිල්ටරයක් ලැබුණු බව සුධර්මා සිනහවෙවී පැවසුවාය.

සුධර්මා දඹානට ගිය පසු කුඩාරමේ ඉදෙන බත්හැලිය විශාල වූයේය. ඒ ඇය වාඩියට පැමිණෙන ආදී වාසී වැඩිහිටියන්ට සේම දරුවන්ට ද ආහාර දෙන බැවිනි. මේ සැමදෙනාම ඇය පිසින ආහාර භුක්ති විඳීමට රුචියක් දැක්වූහ.

එසේ වුවත් බීට් ව්‍යාංජනය පිසූ දිනවල ඒවා හොරෙන් බිමට දැමීම හෝ කුඩාරමෙන් එළියට විසිකර දමන්නට ඔවුනු කටයුතු කරති. මෙය ඇය විමතියට පත්කරවන්න විය.

මොකද මේ අය බීට් ව්‍යංජනේ විසිකරන්නේ. ඒ විතරක් නෙවෙයි ඒ ව්‍යංජනය ගැටුන් බත් පවා විසිකර තිබෙනු ඇය දුටුවාය.

ඇය දිනකදී මේ ගැන වැදි ගැහැණියකගෙන් විමසුවාය. ඇය පැවසුවේ රතුපාට බීට් ව්‍යාංජනය ආහාරයට ගත් විට නෑ යක්කු වෙන බවය. උන් තරහ වෙන බවය. එකල වැඩිපුරම බීට් ව්‍යංජනය විසිකළ තැනැත්තා තිසාහාමිගේ දෙටු පුත් වත්මන් ආදිවාසී නායක ඌරුවරිගේ වන්නිලැත්තන්ය. එවකට ඔහුගේ වයස අවුරුදු පහකි. බීට් ව්‍යංජනය විසිකළ කතාව ඇත්තක් බව වන්නියැලත්තන්ද ලියුම්කරු සමඟ කීවේ සිනාසෙමිනි. එකල ඇතැම් අවස්ථාවල කිරිනැනී තමන්ට බත් කැවූ බව ද වන්නියැලැත්තන් ලියුම්කරු සමග පැවසුවේය. එකම කාරණය එසේ බත් කැවූ දිනෙක බීට් ව්‍යංජන උයා නොතිබීමය.

ගැබිනි මවක බවට පත්වීමෙන් පසුව ඇයට දඹාන හැරදා සිය ස්වාමීයා වන ඒකනායක හූරාගේ නිවෙසට ආපසු එන්නට සිදුවුවත් ඇය දඹානට ආදිවාසීන්ට අපිරිමිත සෙනෙහසක් දැක්වූවාය.

නිමල් අබේසිංහ

ටික් ටොක් රැජිණ

සෙව්වන්දි නයනතාරා



මෙවර 'යූ ටියුබ් ලෝකය' තුළින් ඉරිදා ලංකාදීප සමගින් කතාබහක යෙදෙන්නේ 'ටික්ටොක් රැජිණ' ලෙස තරුණ පිරිස් හඳුන්වනු ලබන තාරුණ්‍යයේ හදබැඳගත් චරිතයක්.

ඇය නමින් සෙව්වන්දි නයනතාරා.

▶ සෙව්වන්දි නයනතාරා ටික්ටොක් රැජින කියලාත් හඳුන්වනවනෙ ඉතින් මේ ආරම්භය සිද්ධ වුණේ කොහොමද?

මෙහි ආරම්භය සිද්ධ වුණේ 2018 අවුරුද්දෙ වගේ මුලින්ම මේ ටික් ටොක් මාධ්‍ය හැඳින්වුණේ 'මියුසිකලි' නමින් නමුත් මුලින් ඒ කාලෙ මේ ඇප් එක ලංකාවෙ එතරම් ප්‍රචලිත ප්‍රසිද්ධ දෙයක් නෙවෙයි. නමුත් මම ඒ ඇප් එක හරහා කරලා තිබුණු වීඩියෝ කිහිපයක් දැක්කම මටත් ආසා ඉතුණා ඒ හරහා වීඩියෝවක් කරන්න, ඉතින් මම මුලින්ම මගේ යාළුවො දෙන්නට තමයි කිව්වෙ අපිත් වීඩියෝවක් කරමු කියලා. නමුත් එයාලට ලැජ්ජයි කියලා කළේ නැහැ. නමුත් මම වීඩියෝ දෙකක් විතර කළා. ඒ කරපු මුල්ම වීඩියෝව හිතාගන්න බැරි විදියට ජනප්‍රිය වුණා. ගොඩාක් දෙනෙක් අතරෙ ෂෙයා වුණා. ඒ තුළින් මාව ගොඩාක් දෙනා දැනගත්තා. ලැබුණු ප්‍රතිචාර නම් අති විශාලයි.

▶ මොනවද නයනතාරා මුලින්ම කරපු වීඩියෝ?

රංගනයන්, නර්තනයන්, ගීත ගායනා හැමදේම එකතු කරගෙන තමයි මම ඒ වීඩියෝ කළේ. ඒ තුළින් විවිධාකාර විදියේ වීඩියෝ කළා. ගීතවලට රංගනයන් එකතු කළා. චිත්‍රපටවල දෙබස් එකතු කරගෙන නිර්මාණයන් කළා. හාස්‍යෝත්පාදක රංගනයන් කළා.

ඇත්තටම මේ හැමදේම කළේ ගෙදර කම්මැලිකමට ඉන්න වෙලාවන්වල තමයි. මම කොහොමත් විවේකයක් ලැබෙන හැම මොහොතකම වගේ කළේ ගීත කියන එක නැත්නම් ගීතවලට නර්තනයක් ඉදිපත් කිරීම තමයි. ඒවා වීඩියෝ කරලා තමයි ගොඩාක්ම ටික්ටොක් මාධ්‍යයට එකතු කළේ. ඉතින් මම හිතුවෙවත් නැති විදියට මම සමාජ මාධ්‍යයට ඒ ජොලියට කරලා දපු වීඩියෝ ගොඩාක් දෙනෙක් අතර ෂෙයා වුණා. ඉතින් ලැබුණු ප්‍රතිචාර අතිවිශාලයි.

▶ මේ විදියේ ආකර්ෂණයක් ලබන්න ප්‍රතිචාර ලබන්න දක්ෂතාවක් තියෙන්නත් ඕනැනෙ. නයනතාරාට කලා හැකියාවන් පුංචි කාලෙ ඉඳන්ම තිබුණද?

මට ගීත කියන්නත්, නර්තනයටත් හැකියාව තිබුණා. නමුත් රංගනයට නම් මට කවදවත්ම කැමැත්තක් තිබුණෙ නැහැ. ඒත් මම පුංචි කාලෙ ඉඳන්ම චිත්‍රපටි බලන්න මාරම ආසයි. එක දවසට හින්දි චිත්‍රපටයක් ගානෙ බලනවා. ඒවා බලලම රංගනයට මොකක් හරි දෙයක් කරගන්න පුළුවන්කමක් තිබුණා මිසක් ඒ සම්බන්ධව දැනුමක් තිබුණෙ නැහැ.

▶ නයනතාරාව නිළියක් කළේත් මේ 'ටික්ටොක්' මාධ්‍යය නේද?

මම ඇත්තටම මේ දේවල් කළේ ටික්ටොක්වලින් නිළියක් වෙන්න නොවෙයි. මේ මාධ්‍යයෙන් නිළියක් වෙන්න පුළුවන් කියලා මම ඇත්තටම දැනගෙන හිටියෙත් නැහැ. හිතුවෙම නැති දෙයක් සිද්ධ වුණේ අහම්බයකින්. මොකද මගේ වීඩියෝ ගොඩක් දෙනෙක්ගේ FB වල ෂෙයා වෙලා තමයි ඒ හරහා මාව දැකලා ටෙලිනාට්‍ය රංගනයට ආරාධනා ලැබෙන්නෙ. මුලින්ම මට ලැබෙන්නෙත් ටෙලිනාට්‍යක ප්‍රධාන චරිතයට රංගනයෙන් දයක වෙන්න.

ඇත්තටම ඒවගේ අවස්ථාවක් සාමාන්‍යයෙන් කෙනෙකුට ලේසියෙන් ලැබෙන්නෙ නැති දෙයක්. ලොකු කට්ටක් කාලානෙ ඒ තැනට යන්න ඕනෑ. මට ඇත්තටම එහෙම දෙයක් කරන්න වුණේ නැහැ. 'ටික්ටොක්' නිසා පළවෙනි ටෙලිනාට්‍යයේම ප්‍රධාන චරිතෙට යන්න ලැබුණා. ඇත්තටම ඒ වගේ අවස්ථාවක් ලබන්න මම ගොඩාක් වාසනාවන්තයි කියලා හිතෙනවා. ඒ හැමදේම මට ලැබුණෙ සමාජ මාධ්‍ය එක්ක එකතුවෙලා ඉන්න අපේම කට්ටිය නිසා තමයි. ඔවුන් අපේ වීඩියෝ දැකලා ෂෙයා කරපු නිසානෙ මේ අවස්ථාවන් ලැබුණෙ.

▶ සාමාන්‍යයෙන් 'ටික්ටොක්' මාධ්‍යය අද සමාජයේ පිළිගන්නෙ නැහැනෙ? පහළටම දාලානෙ කතා කරන්නෙත්. නමුත් නයනතාරාගේ ජීවිතේට සතුට, වාසනාව ගෙනාවෙ මේ මාධ්‍ය නේද?

ටික්ටොක් මාධ්‍යයේ ඇත්තටම හොඳ වගේම නරකත් තියෙනවා. ඒක හොඳ විදියට භාවිතා කරලා දෙයක් කර ගත්තු අයත් ඉන්නවා. ඒ මාධ්‍ය වැරදි විදියට භාවිතා කරලා ජනප්‍රිය වෙන්න බලන පිරිසකුත් ඉන්නවනෙ. ඉතින් අපි මොනම දෙයක් ගත්තත් හොඳ නරක කියනදේ තියෙනවනෙ. තමන් නිවැරදි විදියට ඒවා භාවිතා කිරීම තමයි වටින්නෙ. සමහර වෙලාවට මේ මාධ්‍ය මිනිසුන්ගේ මනස රිලැක්ස් කරගන්න පුළුවන් දෙයක්. තමන් මේ වීඩියෝ නොකළත් මේ දේවල් බලලා සතුටු වෙන්නත් පුළුවන්. වෙලාව යනවා තේරෙන්නෙ නැහැ සමහර වෙලාවට. ඇත්තටම මමත් මුලින්ම මේ දේ කළේ විනෝදංශයට වගේනෙ. නොහිතපු විදියට මට මේ තුළින් ජීවිතේට ලොකු අවස්ථාවන් සහ වටිනාකම් ලැබුණෙ. මගේ කලා කුසලතා ඔපනංවන්න ලොකු පිටිවහලක් වුණා මේ මාධ්‍යයෙන්. අද මේ දේවල් තිබුණෙ නැත්නම් අපේ තියෙන මොනයම් හෝ දක්ෂතාවක් එළියට දෙන්න ලැබෙන්නෙත් නැහැනෙ. අපි ඒ දේවල් වැදගත් විදියට භාවිතා කළා. ජීවිතේ නොහිතපු විදියෙ දේවල් මට ලැබුණා. විශේෂයෙන්ම ප්‍රේක්ෂක ආදරය. ඒ හැමදේම නිසා මේ මාධ්‍ය වැරදියි කියන තැන මම කොතනකවත් කියන්නෙ නැහැ. මට විතරක් නෙමෙයි මේ මාධ්‍ය තුළින් බොහෝ දෙනෙක්ට විවිධ අංශයන් හරහා ඉදිරියට යන්න අවස්ථාවන් ලැබිලා තියෙනවා. විශේෂයෙන්ම මම සඳහන් කරන්න ඕනෑ මට ටෙලිනාට්‍ය රංගනයට විතරක් නෙමෙයි අවස්ථාව ලැබුණෙ. මගේ පළමු ටෙලිනාට්‍ය රංගනයේ තේමා ගීතය ගායනයටත් සම්බන්ධ වෙන්නට අවස්ථාව ලැබුණා.

ඒ හරහා පසුබිම් ගායනයට සම්බන්ධ වෙන්න හැකි වුණා. ඒ අවස්ථාව මට ලැබුණෙ මගෙ පළමු ටෙලිනාටයේ නිෂ්පාදකතුමාගේ මාර්ගයෙන්, ඔහු මගේ වීඩියෝ නරඹලා තිබුණා. නර්තනය, ගායනය, රංගනය හැම අංශයකම දේවල් ඒ තුළ තිබුණ නිසා ඔහු මගේ ඒ දක්ෂතාවයන් දැකලා තමයි ඒ අවස්ථාව ලබා දුන්නෙත්. දැන්නම් ඉතින් මම ටෙලිනාට්‍යවලට අවුරුදු එක හමාරකින් වගේ සම්බන්ධ වෙලා නැහැ. නමුත් ටික්ටොක් මාධ්‍යයේ තවමත් ඉන්න නිසා ප්‍රතිචාරවල නම් අඩුවක් තවම නැහැ.

▶ මේ වෙද්දි නයනතාරාගේ සැමියාත් 'ටික්ටොක්' මාධ්‍යයට සම්බන්ධ කරගෙන නේද ඉන්නේ?

ඔව්. ඒත් ඔහු නම් පොඩ්ඩක්වත් කැමැති නැහැ.' ටික්ටොක්' කරන්න. මම ඉතින් ගමන් බිමන් යද්දී එහෙම වීඩියෝ කරන ඒවා 'ටික්ටොක්' වලට දනවා. ඇත්තටම ඔහු ඒවා කරන්න කැමැති නැත්තෙ ලැජ්ජයි කියලා. මොකද ඔහු කරන්නෙ ව්‍යාපාර කටයුතු. ඒ දේවල්වලට ගියාම කට්ටිය අහනවලු ටික්ටොක්වල ඉන්නවා නේද? දැකලා පුරුදුයි කියලා. නමුත් ඔහුගේ ගෙදර අය විශේෂයෙන්ම නැන්දම්මා මේ මාධ්‍යයට ගොඩාක් කැමැතියි.

උදේ ඉඳන් ඒවා හරිම ආසාවෙන් බලන්නෙ. ඉතින් ඒවාත් එක්ක අපේ ගෙදර ජනප්‍රියම මාධ්‍ය තමයි මේ. ඒ නිසා මමත් මේ මාධ්‍යයත් එක්ක එකතුවෙලා ඉන්නවට කිසිම කෙනෙක්ගෙන් විරුද්ධත්වයක් නැහැ.

▶ මේ දේවල්වලට බැණුම් විවේචන එහෙමත් එනවා ඇති අනිවාර්යයෙන්ම?

අම්මෝ ඔව්. හොඳටම එනවා. නමුත් මම ඒ කිසිම දේකට ප්‍රතිචාර දක්වන්න යන්නෙ නැහැ. දැක්කත් ඒවා නොදැක්කාවගේ ඉන්නෙ. අපි වරදක් කරන්නෙ නැත්නම් කාගෙවත් විවේචන වැඩක් නැහැ සහ අදළ නැහැනෙ.

මම මොකක් හරි වීඩියෝවක් සමාජ මාධ්‍යයට එකතු කළාම 60% හොඳ කියනවා වගේම 40% වගේ විවේචනය කරනවා. මුලදි නම් ඒ විවේචනවලට ගොඩක් රිදුනු තැන් තිබුණා. සමහර කමෙන්ට් නිසා මම සමාජ මාධ්‍යයට එකතු කරපු වීඩියෝ අයින් කරලත් තියෙනවා. නමුත් දැන් මට ඒවා ප්‍රශ්නයක් නෙමෙයි. අද ලංකාවෙ විවේචනයට ලක්වෙන් නැති කෙනෙක් නැහැනෙ.

▶ සමාජ මාධ්‍යයට එකතු කරන වීඩියෝවලට ලැබෙන විවිස් ප්‍රමාණයත් එක්ක ඒ තුළින් මුදල් ලැබෙනවා කියනවා නේද? ඒ නිසා මුදල් ඉපයීමේ පරමාර්ථයෙන්ද ඔබත් මේවා කරන්නේ?

U Tube හරහා නම් මුදල් ලැබෙනවා කියනදේ කවුරුත් දන්නවා. නමුත් ටික්ටොක් වලින් නම් එහෙම මුදලක් ලැබෙන්නෙ නැහැ. මම සමාජ මාධ්‍යයට එකතු කරන සමහර වීඩියෝවලට මිලියන ගණන් විවිස් තියෙනවා. කොච්චර විවිස් ආවත් මුදල් ලැබෙන දෙයක් නම් නැහැ. නමුත් මුදල් හම්බ කරන්න මේ මාධ්‍ය තුළින් වෙනත් අවස්ථා නම් තියෙනවා.

මොකද ටික්ටොක් හරහා ප්‍රමෝෂන් එවනවනෙ. මටත් ඒවා ඇවිල්ලා තියෙනවා. ඒවාට සම්බන්ධ වෙලා මුදල් උපයලා නම් තියෙනවා.

▶ නයනතාරාට මේ සමාජ මාධ්‍ය ගැන මොකද හිතෙන්නෙ සහ අලුත් පරපුරට මේ මාධ්‍ය කෙතරම් වැදගත්ද?

ඇත්තටම මේ දැලි පිහියෙන් කිරි කනවා වගේ වැඩක්. අද පරපුර ගැන කතා කරද්දී නම් මේ සමාජ මාධ්‍ය හරිම භයානක දෙයක් විදියට මම දකින්නෙ. මොකද අපේ කාලෙ වගේ නෙමෙයි දැන්. අද ඉස්කෝලෙ යන ළ